# 9. වෙළෙඳාම, ගෙවුම් තුලනය සහ සංචාරක ව්‍යාපාරය

## 9. 1 සමස්ථ නිරීක්ෂණය

1996 වර්ෂය තුල දී මුහුණ දුන් අසීරු අවස්ථාවන් යටතේ වුවද ආර්ථිකයේ විදේශීය අංශය සැළකිය යුතු ස්ථාවර තත්ත්වයක පැවති බව පෙන්නුම් කෙරිණි. අපනයන සියයට 13 කින් සහ ආනයන සියයට 7 කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ හිගය 1995 දී රුපියල් දශ ලක්ෂ 77,435 (විගැහි දශ ලක්ෂ 997) (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 11.6) සිට 1996 දී රුපියල් දශලක්ෂ 72,731 (විගැහි දශලක්ෂ 909) (ද. දේ. නි. යෙන් සියයට 9.5) ක හිගයක් දක්වා අඩුවිය. 1993 සිට අතිරික්තයක් පෙන්වන ලද සේවා ගිණුම 1996 දී ප්‍රධාන වශයෙන් සංචාරක ව්‍යාපාරයෙන් වූ ලැබීම් අඩුවීම නිසා රුපියල් දශලක්ෂ 5,427 (විගැහි දශලක්ෂ 68) ක හිගයක් වාර්තා කළේය. පෞද්ගලික සංක්‍රාම සියයට 10 කින් වැඩි විය. මේ අනුව වෙළෙඳ, සේවා සහ සංක්‍රාම ගිණුම් වල සමස්ථ ප්‍රතිඵලය වන ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුම 1996 දී රුපියල් දශලක්ෂ 30,157 (විගැහි දශලක්ෂ 378) (ද. දේ. නි. යෙන් සියයට 3.9) ක අඩු හිගයක් පෙන්විය. පසුගිය වසරෙහි ජංගම ගිණුමෙහි හිගය රුපියල් දශලක්ෂ 32,956 (විගැහි දශලක්ෂ 425) (ද. දේ. නි. යෙන් සියයට 4.9) විය. පසුගිය වසරෙහි පසුබෑමකට ලක් වූ පෞද්ගලිකකරණ ලැබීම් ද ඇතුළත්වූ සෘජු ආයෝජන වශයෙන් සළකන ණය නොවන විදේශීය පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම් වල 1996 දී රුපියල් දශලක්ෂ 6,606 (විගැහි දශලක්ෂ 83) ක කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. කෙසේ වුවද, ශුද්ධ නිල ප්‍රාග්ධන ගලාඒම් පැහැදිලි අඩුවීමක් පෙන්නුම් කළේය. සමස්ථයක් වශයෙන් ගෙවුම් තුලනයෙහි රුපියල් දශලක්ෂ 4,148 (විගැහි දශලක්ෂ 63) ක හිගයක් පැවති අතර එය මුලික වශයෙන් නිල ප්‍රාග්ධන ගලාඒම් වල අඩුවීම නිසා සිදු විය.

**සංඛ්‍යා සටහන 9.1**

**ගෙවුම් තුලනය - විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම**

| ශීර්ෂය | වි.ගැ.හි. දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) |
| 1. වෙළෙඳ භාණ්ඩ | -740 | -825 | -1,089 | -997 | -909 | -45,784 | -55,486 | -77,190 | -77,435 | -72,731 |
| අපනයන | 1,745 | 2,046 | 2,235 | 2,504 | 2,822 | 107,855 | 138,174 | 158,554 | 195,092 | 226,801 |
| ආනයන | 2,485 | 2,872 | 3,324 | 3,501 | 3,731 | 153,640 | 193,660 | 235,744 | 272,527 | 299,532 |
| 2. සේවා | -23 | 28 | 8 | 10 | -68 | -1,430 | 1821 | 520 | 763 | -5,427 |
| ලැබීම් | 489 | 535 | 627 | 688 | 648 | 30,256 | 36,050 | 44,363 | 53,487 | 52,053 |
| ගෙවීම් | 513 | 507 | 619 | 678 | 716 | 31,686 | 34,229 | 43,843 | 52,723 | 57,480 |
| 3. භාණ්ඩ හා සේවා (1 + 2) | -763 | -797 | -1,081 | -987 | -976 | -47,214 | -53,665 | -76,671 | -76,672 | -78,158 |
| 4. පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 328 | 402 | 438 | 448 | 492 | 20,253 | 27,090 | 30,989 | 34,820 | 39,485 |
| ලැබීම් | 389 | 454 | 499 | 526 | 579 | 24,037 | 30,592 | 35,345 | 40,891 | 46,467 |
| ගෙවීම් | 61 | 52 | 61 | 78 | 87 | 3,784 | 3,501 | 4,357 | 6,072 | 6,982 |
| 5. නිල සංක්‍රාම (ශුද්ධ) | 130 | 115 | 117 | 114 | 106 | 8,027 | 7,749 | 8,257 | 8,896 | 8,515 |
| 6. ජංගම ගිණුම් ශේෂය (3 + 4) | -306 | -280 | -526 | -425 | -378 | -18,935 | -18,825 | -37,425 | 32,956 | -30,157 |
| 7. මුල්‍ය නොවන ප්‍රාග්ධනය (ශුද්ධ) | 381 | 612 | 700 | 399 | 271 | 23,450 | 41,066 | 49,912 | 30,338 | 21,671 |
| දිගු කාලීන | 293 | 458 | 499 | 383 | 241 | 17,971 | 30,684 | 35,648 | 28,997 | 19,282 |
| සෘජු ආයෝජන | 86 | 134 | 110 | 35 | 83 | 5,315 | 9,107 | 7,815 | 2,931 | 6,606 |
| විදේශ ආයෝජන | 86 | 134 | 110 | 10 | 60 | 5,315 | 9,107 | 7,815 | 1,011 | 4,756 |
| පෞද්ගලිකකරණ ලැබීම් | 0 | 0 | 0 | 25 | 23 | 0 | 0 | 0 | 1,920 | 1,850 |
| පෞද්ගලික දිගු කාලීන (ශුද්ධ) | 18 | 135 | 216 | 49 | 2 | 1,162 | 8,998 | 15,628 | 2,856 | 202 |
| ලැබීම් | 113 | 217 | 281 | 146 | 124 | 7,081 | 14,586 | 20,203 | 10,305 | 10,000 |
| ගෙවීම් | 95 | 83 | 65 | 97 | 122 | 5,920 | 5,588 | 4,574 | 7,449 | 9,798 |
| රාජ්‍ය දිගු කාලීන (ශුද්ධ) | 189 | 190 | 172 | 299 | 156 | 11,494 | 12,579 | 12,204 | 23,210 | 12,474 |
| ලැබීම් (ආ) | 313 | 334 | 311 | 441 | 321 | 19,193 | 22,317 | 22,026 | 34,296 | 25,717 |
| ගෙවීම් | 124 | 144 | 139 | 143 | 165 | 7,699 | 9,738 | 9,822 | 11,086 | 13,243 |
| කෙටි කාලීන | 87 | 153 | 201 | 16 | 30 | 5,479 | 10,382 | 14,265 | 1,340 | 2,388 |
| විවිධ ආයෝජන (ශුද්ධ) | 18 | 48 | 20 | -2 | 4 | 1,122 | 3,272 | 1,334 | -90 | 353 |
| පෞද්ගලික කෙටි කාලීන (ශුද්ධ) | 91 | 105 | 182 | 18 | 26 | 5,652 | 7,110 | 12,930 | 1,430 | 2,035 |
| රාජ්‍ය කෙටි කාලීන (ශුද්ධ) | -22 | 0 | 0 | 0 | 0 | -1,295 | 0 | 0 | 0 | 0 |
| 8. රුපියල් අගය පිළිබඳ ගැලපීම් | | | | | | | | | | |
| 9. විගැහි වෙන් කිරීම් | | | | | | 1,555 | -1,420 | -1,380 | 6,394 | 4,213 |
| 10. වැරදීම් සහ අත්හැරීම් | 58 | 44 | -1 | -37 | 44 | 3,399 | 3,328 | 6,059 | -2,339 | -126 |
| 11. සමස්ථ ශේෂය | 133 | 375 | 173 | -62 | -63 | 9,469 | 24,149 | 17,166 | 1,437 | 4,148 |
| 12. මුල්‍ය වෙනස්වීම් (ඇ) | -133 | -375 | -173 | 62 | 63 | -9,469 | -24,149 | -17,166 | -1,437 | 4,148 |
| විනිමය අනුපාතිකය ශ්‍රී ලංකා රුපියල් / විගැහි | | | | | | 61.75 | 67.39 | 70.75 | 77.74 | 80.23 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| වෙළෙඳ ගිනුම | | | | | | -10.8 | -11.1 | -13.3 | -11.6 | -9.5 |
| ජංගම ගිණුම | | | | | | -4.5 | -3.8 | -6.5 | 4.9 | -3.9 |
| ජංගම ගිණුම - ප්‍රදානයන් රහිතව | | | | | | -6.3 | -5.3 | -7.9 | -6.3 | -5.0 |


මුලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) ගුවන්යානා පහක් ආනයනය කිරීම සඳහා පසුගිය වර්ෂවලදී ගෙවන ලද අත්තිකාරම් ගෙවීම්වල ගැලපුම් 1993, 1994 සහ 1995 ප්‍රාග්ධන ලැබීම්වලට ඇතුලත් වේ.

(ඇ) මුල්‍ය අංශයේ සියළු ගනුදෙනු කාලච්ඡේදයන් අවසානයේ පැවත් විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කොට ඇත. ඍණ ලකුණකින් අතිරික්තය පෙන්නුම් කරයි.

මැද පෙරදිග කලාපයට පසුව ලෝකයේ දෙවන විශාලතම තේ පරිභෝජනය කරන රටවල් බවට පත්ව සිටින ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් වලින් පැවති අධික ඉල්ලුම නිසා මිල ගණන් ඉහළ යාම හේතුවෙන් තේ අපනයන අංශයෙහි යහපත් තත්වයක් ඇතිවිය. ලෝකයේ තේ නිෂ්පාදනය 1996 දී සියයට 4 ක පමණ ප්‍රමාණයක වැඩි වීමක් ඇස්තමේන්තු කර ඇති අතර ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් වල ඉල්ලුම විශාල වශයෙන් වැඩි වුණි. තිරිඟු, සහල් සහ බොරතෙල් ආනයන මිල ගණන් වැඩිවී තිබියදීත් තේ, පොල් නිෂ්පාදිත හා රෙදිපිළි සහ ඇගළුම් නිෂ්පාදිතවල මිල ගණන් ඉහළ යාම පිළිබිඹු කරමින් වෙළෙඳ අනුපාතය සියයට 2 කින් වර්ධනය විය. කාර්මික භාණ්ඩ අපනයන අංශය ගැන සළකන විට බටහිර කාර්මික රටවල් වල යථා තත්වයට පත්වූ ආර්ථික වර්ධනයන් තුලින් ශ්‍රී ලංකාවට සම්පූර්ණ ප්‍රයෝජන ලබා ගත නොහැකි වු අතර 1996 දී කාර්මික අපනයන අංශයෙහි තාවකාලිකව ඇති වූ සැපයුම් අඩාලවීම මේ සඳහා හේතු විය. ආනයන අංශය ගැන බලන විට දේශීය සැපයුම් හිගය තුලින් ඇතිවූ පරතරය පියවීමට මූලික වශයෙන් සහල් ඇතුළු අමතර ආහාර වර්ග ආනයනය කිරීම අවශ්‍ය විය. සහල් හැර අනෙකුත් ආහාර භෝග වර්ග රාශියකම දේශීය සැපයුම් තත්ත්වය වසර අග වන විට වර්ධනය විය. ආර්ථික කටයුතු යථා තත්ත්වයකට පත්වීම පිළිඹිඹු කරමින් වසරෙහි දෙවන භාගය වන විට අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයනය වැඩි විය. 1995 වසර අගදී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙහි තෙල් ගබඩා වලට සිදුකළ ත්‍රස්තවාදී ප්‍රහාරය නිසා විනාශ වූ තොග නැවත සැපයීම සඳහාත් තාප බලය උත්පාදනය කිරීම සඳහා ගුම්තෙල් සහ ඩීසල් වලට පැවති ඉල්ලුම සපුරාලීම සඳහාත් වැඩිපුර ඛණිජ තෙල් ආනයනය කිරීමට සිදු විය. 1996 දී විදුලි බල උත්පාදන යන්ත්‍ර ආනයනය සඳහා වු වියදම විගැහි දශලක්ෂ 43 ක් ලෙය ඇස්තමේන්තු කරන ලදි. 1995 දී එයාර් ලංකා සමාගම එහි ප්‍රතිසම්පාදන වැඩ පිළිවෙල යටතේ ආනයනය කළ අවසන් ගුවන් යානයෙහි වටිනාකම සහ 1996 දී විදුලි බල උත්පාදන යන්ත්‍ර ආනයන වටිනාකම අඩු කළ පසු ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 10 කින් වැඩිවිය.



රූප සටහන 9.1
ගෙවුම් තුලනය
(ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස)


පෞද්ගලිකකරණ වැඩ පිළිවෙළ මුලින් අපේක්ෂා කළ මට්ටමින් ක්‍රියාත්මක නොවුවද පසුගිය වසරෙහි පැවති වටිනාකම හා සමානව යමින් 1996 වසරේදී පෞද්ගලිකකරණ ලැබීම් විගැහි දශලක්ෂ 23 ක් විය. පෞද්ගලික දිගු කාලීන ශුද්ධ ණය ප්‍රාග්ධන ගලාඒම් විගැහි දශලක්ෂ 49 සිට විගැහි දශලක්ෂ 2 දක්වා සැළකිය යුතු ලෙස පහත වැටුණ අතර එය මූලික වශයෙන් එයාර් ලංකා සමාගම එහි ගුවන් යානා ප්‍රතිසම්පාදන වැඩ පිළිවෙල සඳහා කලින් ලබාගෙන තිබූ ණය ආපසු ගෙවීම් වැඩිවීම සහ අළුතින් ණය ලබා නොගැනීමත්, ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන් සඳහා විදේශීය ණය ස්වරූපයෙන් වු ශුද්ධ ණය ගලාඒම් අඩු වීමත් නිසා සිදු විය. ආරක්ෂක කටයුතු හා සම්බන්ධ ආනයන වෙනුවෙන් ගත් ණය වලින් නොගෙවා ඉතිරිව පැවති ණය පියවීමත්, 1996 වර්ෂය තුල විශාල වශයෙන් අළුතින් ණය ලබා නොගැනීමත් නිසා ශුද්ධ නිල ප්‍රාග්ධන ගලාඒම් ද පහත මට්ටමක පැවතිණි.


ආයෝජන වාතාවරණය වැඩි දියුණු කිරීම සඳහා පොදුවේ අදාල වන පියවර කිහිපයක් ගනු ලැබූ අතර එය විදේශීය පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම් වලටද වඩාත් හිතකර පරිසරයක් ඇති කරනු ඇත. මෙහිදී, පෞද්ගලිකකරණ ලැබීම් සඳහා රුපියල් දශලක්ෂ 5,000 ක අඩු මට්ටමේ ඉලක්කයක් සහිත තත්ත්වයක් යටතේ, අය වැය හිගය සියයට 7. 3 කට පමණ සීමා කිරීමේ අවශ්‍යතාව අවධාරණය කිරීම නිසා 1997 වර්ෂයේ දී අයවැය හිගය වැඩිවීමේ අවධානම අවම කරන ලදි. මේ සමගම ආයෝජන මණ්ඩලය යටතට අයත් නොවන සියළුම අපනයන කරුවන් හට විදේශීය ව්‍යවහාර මුදල් වලින් ණය පහසුකම් ලබා දීම ද ඇතුලත්ව අපනයනය අරමුණු කර ගත් සමාගම් සඳහා බදු සහන වැඩි කිරීම තුලින් 1997 අයවැය මගින් පෞද්ලික අංශයට ලබා දුන් නව දිරිගැන්වීම් නිසා නැවතත් පෞද්ලික අංශයේ විශ්වාසය දිනා ගැනීමට සමත් විය. කෙසේ වුවද, සැළසුම් කිරීමේ දුර්වලතාවයන් සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් නිසා සමහර අවස්ථාවල දක්නට ලැබුණු කම්කරු නොසන්සුන්තාවය පෞද්ගලිකකරණ වැඩ පිළිවෙලෙහි වේගය අඩු කළ අතර ඒ මගින් ලැබුනු විදේශීය ප්‍රාග්ධන ගලාඒම් ද අඩු විය. මේ අතර, ආයෝජන මෙරටින් පිටතට ගලායෑම් ගැන සළකන විට වර්තමානයේ ක්‍රියාත්මක වන ඒ ඒ අවස්ථා සළකා බලා ආයෝජනය කිරීමට අවසර දීමේ ක්‍රමය යටතේ වර්ෂය තුළ විදේශයන්හි ආයෝජනය කිරීම සැළකිය යුතු ප්‍රමාණයකින් සිදු විය. මෙයට, නේපාලයේ සහ බංග්ලාදේශයේ වෙළෙඳ බැංකු දෙකක් පිහිටුවීම සහ මාලදිවයිනෙහි සංචාරක හෝටල් අත්පත් කර ගැනීම ඇතුලත් වු අතර එමගින් නවදුරටත් ප්‍රාග්ධන ගිණුමෙහි ගනුදෙනු නිදහස් කිරීමක් පෙන්නුම් කෙරිණි.


1995 දී හඳුන්වා දුන් පරිදි මැදිහත් වීම සඳහා භාවිතා කරන එක්සත් ජනපද ඩොලරයෙහි දෛනික ගැණුම් සහ විකුණුම් මිල එම අනුපාතිකයන් දෙක අතර සියයට දෙකක පරාසයක් සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කිරීම නොකඩවා සිදු විය. ඒ අනුව වාණිජ බැංකුවලට ඔවුන්ගේ මිළදී ගැණුම් හා විකුණුම් අනුපාතිකයන් මෙම පුළුල් පරාසය තුළ වඩාත් නම්‍යශීලීව ප්‍රකාශයට පත්කිරීමට අවස්ථාව සැළසුණි. වාණිජ බැංකු අන්තර් බැංකු වෙළෙඳ පොලින් මිලදී ගනිමින් ඔවුන්ගේ ශුද්ධ විදේශ විනිමය ශේෂයන් පවත්වා ගැනීමට උත්සාහ කරනවාට වඩා ඔවුන්ගේ ශුද්ධ විදේශීය වත්කම් යම් ප්‍රමාණයකින් අඩු වීමට ඉඩ දෙමින් විනිමය වෙළෙඳපලෙහි පීඩනයෙන් කොටසක් උකහා ගැනීමට කැමැත්ත දැක්විය. ඒ අනුව රුපියල් එ.ජ. ඩොලර් අනුපාතිකය තුලින් මූලික වශයෙන් වෙළෙඳපලෙහි උපනතිය පෙන්නුම් කරනු ලැබීය. ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ජාත්‍යන්තර සංචිත තත්ත්වය ද යහපත් මට්ටමක පැවතීම නිසා සංචිත ප්‍රමාණය ආරක්ෂා කිරීම අරමුණු කරගෙන වෙළෙඳපල තුල බලපෑම් කිරීමට මහ බැංකුවට අවශ්‍ය නොවිය. 1996 වර්ෂය තුල පැවති අධික උද්ධමනකාරී තත්ත්වයෙන් වැඩි කොටසක් සාර්ව ආර්ථික අසමතුලිතතාවය හේතුවෙන් නොව තාවකාලික සැපයුම් අඩාලවීම් හා සම්බන්ධ වු අස්ථිර භාවය නිසා සිදු වුවක් විය. එම උද්ධමනකාරී තත්ත්වයට එරෙහිව එලදායී නාමික ප්‍රතිපත්ති උපකරණයක්


රූප සටහන 9.2

## විදේශීය වෙළෙඳාම




### සංඛ්‍යා සටහන 9.2
### විදේශ වෙළෙඳමෙහි ක්‍රියාකාරිත්වය

| වර්ෂය | වර්ධන අනුපාතික | | මිළ දර්ශක (1990 = 100) | | අනුපාත | |
|---|---|---|---|---|---|---|
| | අපනයන | ආනයන | අපනයන | ආනයන | වෙළෙඳ අනුපාතිකය (අ) | අපනයන/ ආනයන |
| 1992 | 20.3 | 11.2 | 131.8 | 108.8 | 121.1 | 0.70 |
| 1993 | 17.1 | 15.4 | 144.7 | 114.6 | 126.3 | 0.71 |
| 1994 (ආ) | 9.2 | 15.7 | 151.2 | 121.0 | 125.4 | 0.67 |
| 1995 (ආ) | 12.0 | 5.3 | 174.2 | 140.2 | 124.2 | 0.72 |
| 1996 (ඇ) | 12.7 | 6.7 | 194.9 | 153.2 | 127.2 | 0.76 |

මූලයන් ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) (අපනයන මිළ දර්ශකය/ ආනයන මිළ දර්ශකය) X 100
(ආ) සංශෝධිතයි
(ඇ) තාවකාලිකයි

වශයෙන් විනිමය අනුපාතිකය පිළබඳ මෙම ප්‍රතිපත්තිය වාණිජ බැංකු මෙන්ම මහ බැංකුවද භාවිත කරනු ලැබිය.

1996 වර්ෂය තුලදී රටේ විදේශ වත්කම් විගැහි දශලක්ෂ 28 කින් අඩු විය. දළ විදේශ වත්කම් දෙසැම්බර් මස අවසානයේදී විගැහි දශලක්ෂ 1,701 ක් වූ අතර එම ප්‍රමාණය 1997 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද මාස 5 ක ආනයන මුල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය. භාණ්ඩ, සේවා සහ පෞද්ගලික සංක්‍රාමවල ප්‍රතිශතයක් වශයෙන් ගණනය කිරීමේ දී ණය සේවා ගෙවීම්. අනුපාතිකය 1995 සියයට 11.9 සිට 1996 සියයට 13.0 දක්වා වැඩිවිය.

මේ අතර තීව්‍ර කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් වල දෙවන අදියර 1997 දී අවසන් කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන් කළයුතු අංශ පිළිබඳව එකගත්වයකට පැමිණීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව සමග මූලික සාකච්ඡා වර්ෂය තුල දී පවත්වන ලදී.

## 9.2 අපනයන

නියගය සහ ඒ තුළින් සිදු වූ බලශක්ති අර්බුදය හේතුකොට ගෙන කෘෂිකාර්මික සහ කාර්මික කටයුතුවල පසුබෑමක් තිබියදීත්, 1996 දී විගැහි දශලක්ෂ 2,822 ක් වූ අපනයන ඉපැයීම් 1995 දී වූ සියයට 12 ක වර්ධනය අභිබවමින් සියයට 13 ක වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනය සියළුම

## සංඛ්‍යා සටහන 9.3
## අපනයන සංයුතිය


| කාණ්ඩය | විගැහි දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994 | 1995 | 1996(අ) | 1992 | 1993 | 1994 | 1995 | 1996(අ) |
| 1 කෘෂිකාර්මික අපනයන | 429 | 469 | 490 | 546 | 662 | 26,504 | 31,618 | 34,692 | 42,478 | 53,206 |
| තේ | 241 | 295 | 296 | 317 | 424 | 14,893 | 19,911 | 20,964 | 24,638 | 34,067 |
| රබර් | 48 | 46 | 51 | 74 | 72 | 2,960 | 3,086 | 3,582 | 5,713 | 5,753 |
| පොල් | 60 | 41 | 53 | 68 | 76 | 3,691 | 2,796 | 3,761 | 5,270 | 6,091 |
| පොල් මද නිෂ්පාදන | 43 | 27 | 35 | 45 | 56 | 2,665 | 1,847 | 2,476 | 3,520 | 4,469 |
| වෙනත් | 17 | 14 | 18 | 23 | 20 | 1,026 | 949 | 1,285 | 1,750 | 1,622 |
| වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන | 80 | 87 | 90 | 88 | 91 | 4,959 | 5,825 | 6,385 | 6,857 | 7,295 |
| 2 කාර්මික අපනයන (ආ) (ඇ) | 1,251 | 1,502 | 1,672 | 1,885 | 2,072 | 77,281 | 101,437 | 118,544 | 147,069 | 166,543 |
| රෙදිපිළි හා ඇගළුම් | 862 | 1,009 | 1,081 | 1,219 | 1,311 | 53,209 | 68,150 | 76,685 | 94,946 | 105,341 |
| ඛණිජ තෙල් නිෂ්පාදන | 45 | 57 | 56 | 56 | 72 | 2,771 | 3,801 | 3,959 | 4,349 | 5,740 |
| වෙනත් | 345 | 437 | 535 | 611 | 690 | 21,301 | 29,486 | 37,900 | 47,774 | 55,463 |
| 3 ඛනිජමය අපනයන | 45 | 54 | 60 | 57 | 66 | 2,749 | 3,653 | 4,292 | 4,447 | 5,292 |
| මැණික් | 40 | 50 | 55 | 51 | 59 | 2,482 | 3,402 | 3,917 | 3,972 | 4,771 |
| වෙනත් | 4 | 4 | 5 | 6 | 6 | 267 | 251 | 375 | 475 | 521 |
| 4 වර්ග නොකළ අපනයන (ඇ) (ඈ) | 22 | 21 | 13 | 16 | 22 | 1,321 | 1,467 | 1,026 | 1,098 | 1,760 |
| මුළු අපනයන (ආ) (ඈ) | 1,747 | 2,046 | 2,235 | 2,504 | 2,822 | 107,855 | 138,175 | 158,554 | 195,092 | 226,801 |

(අ) තාවකාලිකයි
(ආ) ගලපනලදී
(ඇ) සංශෝධිතයි
(ඈ) ප්‍රතිඅපනයන ඇතුලත්ය

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව
ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රධාන අපනයන අංශයයන්හි දක්නට ලැබුණි. මුළු අපනයන ඉපැයීම් වලින් සියයට 73 කට දායක වූ කාර්මික අපනයන ඉපැයීම් සියයට 10 ක වර්ධනයක් වාර්තා කළ අතර, මෙම වර්ධනය මිල සහ අපනයන ප්‍රමාණය යන දෙඅංශයෙහිම පිළිබිඹු විය. මේ අතර මුළු අපනයන වලින් සියයට 23 ක් නියෝජනය කල කෘෂිකාර්මික අපනයන ඉපැයීම්, තේ හා පොල් නිෂ්පාදනවල ඉහළ මිල ගණන් හේතුකොට සියයට 21 කින් වැඩි විය.

රූපසටහන 9.3
ප්‍රධාන කාණ්ඩ අනුව අපනයන වටිනාකම





## වැවිලි භෝග

1996 වසරේදී වැවිලි භෝගවලින් ලත් අපනයන ඉපැයීම් විගැහි දශලක්ෂ 571 දක්වා සියයට 25 කින් වැඩි වූ අතර, එය මුළු අපනයන ඉපැයීම් වලින් සියයට 20 ක් විය. අපනයනය කළ තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් දශලක්ෂ 244 දක්වා සියයට 1.4 කින් තවදුරටත් වැඩි වූ අතර තේ මිල සියයට 32 කින් වැඩි විය. 1996 වසරේදී තේ මිල ඉහළයාමට දායක වූ සාධකයන් වූයේ රුසියානු සමූහාණ්ඩුව හා ස්වාධීන පොදුරාජ්‍ය මණ්ඩලීය හා අසල්වාසී රටවලට තේ බෙදාහැරීමේ ප්‍රමුඛ මධ්‍යස්ථානයන් වශයෙන් වර්ධනය වූ තුර්කිය යන රටවලින් නොකඩවා ඇති වූ අධික ඉල්លුම හා ශ්‍රී ලංකාවේ තේවල ගුණාත්මක තත්ත්වය වැඩි දියුණු වීමය. ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් ප්‍රධාන ගැණුම්කරු වශයෙන් මුළු තේ අපනයන ප්‍රමාණයෙන් සියයට 19 ක් ද (කිලෝග්‍රෑම් දශලක්ෂ 47) තුර්කිය දෙවන විශාලතම ගැණුම්කරුවා වශයෙන් සියයට 13 ක් ද (කිලෝග්‍රෑම් දශලක්ෂ 31) මිලදී ගත්තේය. අනෙකුත් ප්‍රධානතම ගැණුම්කරුවන් වූයේ සිරියාව (සියයට 9), ජෝර්දානය (සියයට 6), ඉරානය (සියයට 4) සහ සෞදි අරාබිය (සියයට 4) යි. එක්සත් රාජධානියට අපනයනය කළ තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් දශලක්ෂ 8 දක්වා සියයට 38 කින් පහත වැටුණු අතර, එය ලන්ඩන් වෙන්දේසි වලට කල නැව්ගත කිරීම් පහත වැටීම තුළින් පිළිබිඹු විය.

1996 වසරේදී අපනයනය කරන ලද රබර් ප්‍රමාණය සියයට 6 කින් ඉහළ ගිය නමුත් මිල පහත වැටීම (සියයට 8 කින්) නිසා රබර් අපනයන ආදායම විගැහි දශලක්ෂ 72 දක්වා සියයට 3 කින් පහත වැටුණි. ඉන්දුනීසියාව,

රූපසටහන 9.4
ප්‍රධාන කාණ්ඩ අනුව කාර්මික අපනයන වටිනාකම්




තායිලන්තය හා මැලේසියාව වැනි ප්‍රධාන රබර් නිෂ්පාදිත රටවල පැවති හිතකර දේශගුණික තත්ත්වය හේතුවෙන් නිෂ්පාදිත අතිරික්තයක් පැවතීම හා අඛණ්ඩ සැපයුමක් පැවතීම නිසා, 1996 වර්ෂයේ දී ජාත්‍යන්තර රබර් මිල තරමක් දුරට දුර්වල විය. මීට අමතරව, ජර්මනිය, ප්‍රංශය හා එක්සත් රාජධානියේ මෝටර් රථ නිෂ්පාදනයේ පැවති මන්දගාමී වර්ධනයත් වසරේ මුල් අවධියේදී ඇමෙරිකා එක්සත් ජනපදයේ කම්කරු ප්‍රශ්න හේතුවෙන් ප්‍රධාන ටයර් නිෂ්පාදකයින්ගෙන් ඉල්ලුමක් නොමැති වීමත් 1996 වසර තුළදී ස්වාභාවික රබර් මිල පහත වැටීමට දායක විය.

1996 වසරේදී ප්‍රධාන පොල්මද නිෂ්පාදන වර්ග තුනෙහි අපනයන ඉපැයීම් විගැහි දශලක්ෂ 56 දක්වා සියයට 24 කින් වැඩි විය. පොල් ගෙඩියක සාමාන්‍ය නැ.වි.ස. මිල සියයට 50 කින් ඉහළ නැගුණි. දේශීය සැපයුමෙහි පහත් මට්ටමක් පිළිබිඹු කරමින් අපනයන ප්‍රමාණය සියයට 18 කින් පහත වැටුණි. මෙම වසරේදී ජාත්‍යන්තර මිල වැඩිවීම් වලට ප්‍රධාන වශයෙන් දායක වූයේ 1995 අවසාන භාගයේ ලෝකයේ ප්‍රධානතම පොල් නිෂ්පාදකයා හා අපනයනකරුවා වූ පිලිපීනයේ පොල් නිෂ්පාදනය පහත වැටීමයි. මේ අතර, අහිතකර දේශගුණික තත්ත්වයන්ගේ පසුකාලීන බලපෑම නිසා දේශීය පොල් නිෂ්පාදනයේ පහත වැටීම දේශීය සැකසුම් නිෂ්පාදන සඳහා වූ පොල් ගෙඩි ප්‍රමාණය අඩුවීමට හේතු විය. 1996 දී අනෙකුත් පොල් නිෂ්පාදනවල (කොහු කෙඳි නිෂ්පාදිත සහ පොල් කටු නිෂ්පාදිත ආදිය) ඉපැයීම් සියයට 10 කින් පහත වැටුණි.

## අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදිත

1996 දී අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදිතයන්ගේ අපනයන ඉපැයීම සියයට 3 කින් වැඩිවිය. මෙම අංශයට ගැනෙන වෙළෙඳ ද්‍රව්‍යයන් මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරයි. මිල සහ ප්‍රමාණය වැඩිවීම හේතුවෙන්, සකස් නොකළ දුම්කොළ සහ කුරුඳු අපනයන ඉපැයීම් පිළිවෙලින් සියයට 24 කින් හා සියයට 8 කින් වැඩිවිය. අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදනයන් ගෙන් ලද මුළු ඉපැයීම් වලින් සියයට 58 ක් ම නියෝජනය කළේ මෙම අපනයන දෙවර්ගයයි. මිල හා ප්‍රමාණයේ ඉහළයාම නිසා අපනයන ඉපැයීම් වැඩි වූ අනෙකුත් වෙළෙඳ ද්‍රව්‍ය නම් සාදික්කා හා වසාවාසි (සියයට 38), බුලත් (සියයට 17), කරාබුනැටි (සියයට 25), පුවක් (සියයට 17) සහ ගම්මිරිස් (සියයට 5) වේ. මේ අතර මිල හා ප්‍රමාණය පහත වැටීම නිසා කෝපි (සියයට 58), වාෂ්පශීලී තෙල් (සියයට 33) හා කපු (සියයට 11) වලින් ලත් අපනයන ඉපැයීම් පහත වැටිණි.

## කාර්මික නිෂ්පාදිත

ඇඟළුම් මූලිකවූ කාර්මික අපනයන පෙරමුණුකොටගෙන පසුගිය දශක දෙක තුළදී, අපනයන ව්‍යුහයෙහි විශාල වෙනසක් සිදුවිය. පසුගිය දස වසර තුළදී කාර්මික අපනයන වාර්ෂිකව සියයට 16 කින් වර්ධනය විය. 1996 දී කාර්මික අපනයන වර්ධනය තරමක් අඩු වුවද සමස්ථයක් වශයෙන් සියයට 10 ක වර්ධන අනුපාතයක් ලඟාකර ගැනීමට සමත් විය. වසර තුළදී ප්‍රධාන වැඩිවීම් වාර්තා වූයේ ඛණිජ තෙල් නිෂ්පාදිත (සියයට 28) හා ඛණිජ තෙල් නොවන කාර්මික අපනයන (සියයට 13) වලිනි. 1995 දී වූ සියයට 13 ක වර්ධනය හා සසඳන කළ 1996 දී රෙදිපිළි හා ඇඟළුම් අපනයනයන්හි සියයට 8 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. රෙදිපිළි සහ ඇඟළුම් අපනයන ප්‍රමාණය සියයට 5 කින් වැඩිවිය. පසුගිය වසර කිහිපයේදී මෙන්ම, මෙම වසරේදී ද ඇඟළුම් ඒකකයක සාමාන්‍ය මිල තවදුරටත් වැඩි වූ අතර, එයට අර්ධ වශයෙන් හේතු වූයේ අඩු එකතුවූ අගයක් සහිත ඇඟළුම්වල සිට ඉහළ එකතු වූ අගයක් සහිත ඇඟළුම් නිෂ්පාදනයට මාරුවීමය. රෙදිපිළි හා ඇඟළුම් අපනයන ප්‍රමාණයේ වර්ධනය පහත වැටීම විශේෂයෙන් 1996 මැද භාගයේ දී වාර්තා වූ අඩු අපනයන ප්‍රමාණයේ ප්‍රතිඵලයකි. පෞද්ගලික විදුලිජනක යන්ත්‍ර භාවිතයට පෙළඹවීම සඳහා කළ දිරිගැන්වීම් සහ සැප්තැම්බර් මාසයේ සිට විදුලිය කැපීම අත්හිටුවීම නිසා 1996 ඔක්තෝබර් මාසයේ සිට රෙදිපිළි හා ඇඟළුම් අපනයන ප්‍රමාණයෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. රෙදිපිළි හා ඇඟළුම් අපනයන, මුළු කාර්මික අපනයනවලින් සියයට 63 කට දායක විය. මෙම අංශය තුළ සියයට 21 ක ඉහළ වර්ධන අනුපාතයක් වාර්තා වූයේ වියන ලද රෙදිපිළි අංශයෙහිය.

ඛණිජ තෙල් නිෂ්පාදිත අපනයනයන්ගෙන් ලත් ඉපැයීම් 1996 දී විගැහි දශලක්ෂ 72 ක් දක්වා සියයට 28 කින් ඉහළ නැගුණි. ඛණිජ තෙල් අපනයන ප්‍රමාණය සියයට 12 කින් වැඩි වූ අතර, මිල ගණන් සියයට 15 කින් වැඩිවිය. ජාත්‍යන්තර ඛණිජ තෙල් මිල ඉහළයාම පිළිබිඹු කරමින්, වසරේ අවසාන භාගයේ දී ඛණිජ තෙල් නිෂ්පාදනවල මිල ඉහළ නැගුණි. 1996 දී ඛණිජ තෙල් නිෂ්පාදිත අපනයන ඉපැයීම් කාර්මික අපනයනයන්ගෙන් සියයට 3 ක් විය.

අනෙකුත් කාර්මික අපනයනයන්ගෙන් ලත් ආදායම 1996 දී සියයට 13 කින් ඉහළ නැගුණු අතර, මෙම අංශයේ ඉපැයීම් මුළු කාර්මික අපනයන ඉපැයීම් වලින් සියයට 33 ක් විය. සම්, රබර්, කඩදාසි, දැව සහ පිඟන් භාණ්ඩ යන අපනයන කාණ්ඩයන්හි ඉපැයීම් විගැහි දශලක්ෂ 285 දක්වා සියයට 10 කින් වර්ධනය විය. මෙම අපනයන කාණ්ඩය තුළ රබර් නිෂ්පාදිත, පාවහන් හා සංචාරක භාණ්ඩ ඇතුලත් සම් භාණ්ඩවලින් ලද ඉපැයීම්වල සැලකිය යුතු වර්ධනයක් වාර්තාවූ අතර ලී වලින් කල විසිතුරු භාණ්ඩ හා වෙනත් එවැනි භාණ්ඩ අපනයනය සැලකිය යුතු ලෙස පහත වැටුණි. අනෙකුත් කාර්මික අපනයන අතර, ඉපැයීම් වැඩිවීම් වාර්තා වූ කාණ්ඩ නම් යන්ත්‍රසූත්‍ර, යාන්ත්‍රික හා විදුලි උපකරණ (සියයට 31), ප්ලාස්ටික් (සියයට 20) හා ස්වර්ණාභරණ (සියයට 16) ය. අපනයන වෙළෙඳපොලට ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම සඳහා 1996 ජනවාරි 1 වෙනිදා සිට තීරු බද්දෙන් නිදහස් පදනම යටතේ අගනා ලෝහ වර්ග නිකුත් කිරීම නිසා ස්වර්ණාභරණ අපනයන උප අංශයට වාසි සැලසුණි. මෑත කාලයේදී සෙල්ලම් බඩු හා ක්‍රීඩා උපකරණ හා ක්‍රීඩා භාණ්ඩ අපනයනයෙහි සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කෙරේ. පුළුන් ආදිය පුරවා සකස් කළ සෙල්ලම් බඩු අපනයනයේ සිදු වූ සීඝ්‍ර වර්ධනය හේතුවෙන් මෙම අංශය තුළ ඉපැයුම් 1995 දී වූ විගැහි දශලක්ෂ 31 හා සසඳන කළ 1996 දී විගැහි දශලක්ෂ 46 ක් විය.

## ඛණිජ නිෂ්පාදන

1996 වසරෙහි අයවැය ලේඛනයෙන් මැණික් ගල් කැපීමේ හා සැකසීමේ යන්ත්‍ර හා උපකරණ සඳහා සපයන ලද තීරුබදු සහනය නිසා අගනා හා අර්ධ අගනා ගල්වර්ග වලින් ලද ඉපැයුම්වල සැළකිය යුතු වර්ධනයක් පිළිබිඹු කරමින් 1996 වසරේදී ඛණිජ නිෂ්පාදන අපනයන විගැහි දශලක්ෂ 66 දක්වා සියයට 15 කින් වැඩිවිය. අපනයන සංවර්ධන මණ්ඩලයෙහි අනුබල දීමේ කටයුතු වලට අමතරව මැණික් ගල් වර්ණ සංයෝගය මත වර්ග කිරීම හා ඇ.එ.ජ. වෙළෙඳපොලට කරන ලද නිල් කැට හඳුන්වාදීම හා ජපන් වෙළෙඳපොලට ක්‍රමාංකණය කරන ලද ගල් හඳුන්වාදීමද මෙම වර්ධනයට දායක විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සකස් කළ මැණික් අපනයන ප්‍රමාණය සියයට 20 කින් වැඩි වූ අතර, අපනයන වටිනාකම 1995 වසරෙහිවූ විගැහි දශලක්ෂ 51 සිට 1996 විගැහි දශලක්ෂ 59 දක්වා වැඩිවිය. ස්වාභාවික මිනිරන්, ලෝපස් හා යපස් අපනයන වැඩිවීමේ හේතුවෙන් අනෙකුත් ඛණිජ අපනයන වලින් ලද ඉපැයුම් විගැහි දශලක්ෂ 6 ක් දක්වා සුළු වශයෙන් ඉහළ නැගුණි.

## 9.3 ආනයන

1995 පැවති සියයට 5 ක වර්ධනය හා සසඳන කළ, ආනයන සියයට 7 ක මධ්‍යස්ථ වර්ධන වේගයක් වාර්තා කළේය. සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩයන්හි සැලකිය යුතු වැඩිවීමක් පිළිබිඹු කළ අතර, සහල් හා තිරිඟු

### සංඛ්‍යා සටහන 9.4
### ආනයනයන්හි අවසන් උපයෝජනය අනුව කෙරෙන වර්ගීකරණය

| කාණ්ඩය | විගැහි දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994 | 1995 | 1996(අ) | 1992 | 1993 | 1994 | 1995 | 1996(අ) |
| 1 පාරිභෝගික භාණ්ඩ | 595 | 639 | 730 | 778 | 851 | 36,746 | 42,981 | 51,810 | 60,508 | 68,372 |
| ආහාර සහ පාන වර්ග | 372 | 383 | 419 | 475 | 553 | 22,944 | 25,675 | 29,739 | 36,901 | 44,577 |
| සහල් | 46 | 35 | 9 | 2 | 63 | 2,852 | 2,386 | 655 | 122 | 5,118 |
| සීනි | 80 | 84 | 125 | 113 | 100 | 4,952 | 5,621 | 8,875 | 8,737 | 8,026 |
| තිරිඟු | 74 | 83 | 82 | 131 | 141 | 4,549 | 5,609 | 5,825 | 10,155 | 11,267 |
| වෙනත් | 172 | 180 | 203 | 230 | 249 | 10,591 | 12,059 | 14,384 | 17,887 | 19,966 |
| වෙනත් පාරිභෝගික භාණ්ඩ | 224 | 256 | 311 | 303 | 298 | 13,802 | 17,306 | 22,071 | 23,607 | 23,995 |
| 2 අන්තර් භාණ්ඩ | 1,264 | 1,456 | 1,607 | 1,778 | 1,907 | 78,043 | 98,343 | 114,004 | 138,475 | 153,117 |
| ඛණිජ තෙල් | 226 | 221 | 206 | 254 | 330 | 13,938 | 14,920 | 14,641 | 19,827 | 26,525 |
| පොහොර | 38 | 46 | 44 | 57 | 52 | 2,366 | 3,108 | 3,097 | 4,406 | 4,189 |
| රසායනික ද්‍රව්‍ය | 67 | 78 | 84 | 94 | 92 | 4,125 | 5,244 | 5,975 | 7,310 | 7,402 |
| රෙදිපිළි හා ඇඟළුම් | 543 | 617 | 723 | 763 | 805 | 33,552 | 41,740 | 51,299 | 59,375 | 64,601 |
| වෙනත් | 390 | 494 | 550 | 610 | 628 | 24,062 | 33,331 | 38,992 | 47,557 | 50,400 |
| 3 ආයෝජන භාණ්ඩ | 604 | 750 | 952 | 784 | 830 | 37,294 | 50,508 | 67,524 | 60,916 | 66,647 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 277 | 332 | 390 | 331 | 448 | 17,098 | 22,377 | 27,635 | 25,769 | 35,987 |
| ගමනා ගමන උපකරණ (ආ) | 128 | 224 | 316 | 201 | 123 | 7,889 | 15,012 | 22,425 | 15,564 | 9,885 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 129 | 138 | 168 | 179 | 181 | 7,936 | 9,342 | 11,898 | 13,956 | 14,540 |
| වෙනත් | 71 | 56 | 79 | 73 | 78 | 4,371 | 3,777 | 5,566 | 5,627 | 6,235 |
| 4 වර්ග නොකළ ආනයන | 24 | 26 | 32 | 156 | 142 | 1,472 | 1,718 | 2,238 | 12,301 | 11,288 |
| මුළු ආනයන (ඇ) | 2,487 | 2,870 | 3,321 | 3,497 | 3,730 | 153,555 | 193,550 | 235,576 | 272,200 | 299,424 |

(අ) තාවකාලිකයි
(ආ) 1993, 1994, 1995 වර්ෂවල ආනයනය කරන ලද ගුවන් යානාවල වටිනාකම ඇතුලත් වේ.
(ඇ) ගලපනලද්

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව
ලංකා පොහොර සමාගම හා පොහොර ආනයනයකරුවෝ
ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව
ශ්‍රී ලංකා මහ බැංකුව

සඳහා වන ආනයන වියදම් වැඩිවීම හේතුකොට පාරිභෝගික භාණ්ඩ අනෙකුත් කාණ්ඩයන්ට වඩා වැඩි වේගයකින් (සියයට 9 ක වැඩිවීම) වර්ධනය විය. අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ පිළිවෙලින් සියයට 7 කින් හා සියයට 6 කින් වැඩිවීම, 1996 වසර තුළ මධ්‍යස්ථ ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට උපකාරී විය.

## පාරිභෝගික භාණ්ඩ

පාරිභෝගික භාණ්ඩ කාණ්ඩය තුළ ආහාර පාන ආනයනය සියයට 16 කින් වැඩිවිය. අනෙකුත් පාරිභෝගික භාණ්ඩ සඳහා විශේෂයෙන් කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ සඳහාවූ ඉල්ලුම පහත මට්ටමක පැවතුන අතර, ඒ සඳහා වන ආනයන වියදම සියයට 2 කින් අඩුවිය. මහ කන්නයෙහි වී වගාව පාලු වීම හේතුකොට විශාල දශලක්ෂ 63 ක් වූ සහල් මෙට්‍රික් ටොන් 341,200 ක් ආනයනය කිරීමට සිදු වූ අතර, 1995 දී සහල් ආනයන වටිනාකම විශාල දශලක්ෂ 2 ක් පමණක් විය. මෙය 1977 න් පසුව සිදුකළ වැඩිම සහල් ආනයන ප්‍රමාණයයි. පාරිභෝගිකයාට සහන සැලසීම මුල් කොට ගෙන අප්‍රේල් මාසයේ දී සහල් ආනයන සඳහා වන තීරු බදු ඉවත් කළේය. සීනි හා කෑමට යෝග්‍ය තෙල් සඳහා ආනයන බදු සහනයන් ප්‍රදානය කරන ලදී. 1996 ප්‍රථම කාර්තු දෙක තුළ සහල් වල ජාත්‍යන්තර මිල ගණන් ස්ථාවරව පැවතුන අතර, තායිලන්තය, ඉන්දියාව වැනි ප්‍රධාන නිෂ්පාදිත රටවල විශාල අපනයන සැපයුමක් පැවතිමත් විශේෂයෙන් අවසාන කාර්තුවේ දී තිරිඟු වැනි ආදේශක භාණ්ඩවල මිල පහත වැටීමත් හේතුකොට අවසන් කාර්තු දෙක තුළ සහල් මිල ක්‍රමයෙන් පහත වැටුණි. 1995 ට වඩා ආන්තික වශයෙන් නිෂ්පාදනයේ වර්ධනයක් සිදුවුවද, ප්‍රධාන නිෂ්පාදිත රටවල අයහපත් කාලගුණය හේතුකොට 1996 වසරේ තිරිඟු නිෂ්පාදනය පෙර පැවැති නිෂ්පාදන මට්ටම් හා සසඳන කළ ඉතා පහළ මට්ටමක පැවතිම තිරිඟුවල ජාත්‍යන්තර මිල ගණන් විශේෂයෙන් 1996 පළමු කාර්තු තුන තුළ ඉහළ මට්ටමක පැවතීමට හේතු විය. පිටි මිල වල පාලන 1996 දී ඉහළ දැමීම හේතුවෙන් ඇති වූ දේශීය ඉල්ලුමෙහි පහත වැටීම පිළිබිඹු කරමින් තිරිඟු ආනයන ප්‍රමාණය (සියයට 14) පහත වැටීම, ආනයන වියදම් කෙරෙහි ඉහළ තිරිඟු මිල නිසා ඇති වූ අයහපත් බලපෑම තරමක් දුරට සමනය කිරීමට උපකාරී විය. ඉහල ගිය මිල ගණන් නිසා කිරි හා කිරි නිෂ්පාදන ආනයන වියදම සියයට 4 කින් වැඩි විය. අනෙකුත් ආහාර ආනයනය සියයට 10 කින් වැඩි වූ අතර, මේ කෙරෙහි 1996 ජුනි මාසයේ දී අල හා ලොකු ළූණු සඳහා බලපත්‍ර අවශ්‍යතාවය ඉවත් කිරීම තරමක් දුරට බලපෑවේය. ආනයනිත ප්‍රමාණය සියයට 9 කින් අඩුවීමේත් හා ජාත්‍යන්තර මිල ගණන් වල පහළ බැසීමේත් ප්‍රතිඵලයක් ලෙස සීනි ආනයනය සියයට 11 කින් අඩුවිය.

බෙහෙත් සහ ඖෂධ භාණ්ඩ වර්ග වල වියදම (සියයට 11 කින්) පහළ වැටීමත්, මෝටර් රථ සහ යතුරු පැදි තොග පවත්වා ගැනීමේ පිරිවැය ඉහළ මට්ටමක පැවතිමත්, 1996 වසර තුළ බැංකු ණය පහසුකම් සීමා කිරීමත්, හේතුවෙන් කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ ආනයනයේ තියුණු පහත බැසීම හේතුකොට අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 2 කින් අඩුවිය. දේශීය ඖෂධ නිෂ්පාදන බෙහෙවින් ප්‍රයෝජනයට ගැනීම හේතුවෙන් බෙහෙත් සහ ඖෂධ භාණ්ඩ ආනයනය අඩුවිය. එතෙර රැකියාවල නියුතු වුවන්ගේ මුදල් නොකඩවා ගලාඒමේ ප්‍රතිඵලයක් ලෙස ගුවන් විදුලි සහ රූපවාහිනී යන්ත්‍ර සඳහා පැවති ඉල්ලුම වැඩිවීම, මෙම භාණ්ඩ ආනයනය සඳහා වූ වියදම සියයට 9 කින් වැඩිවීමට හේතු විය.

**සංඛ්‍යා සටහන 9.5**

**ප්‍රධාන ආනයන්හි ප්‍රමාණ (අ)**

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 1992 | 1993 | 1994 | 1995 | 1996 (ආ) |
|---|---|---|---|---|---|
| සහල් | 237 | 209 | 58 | 9 | 341 |
| 1 වන කාර්තුව | 67 | 48 | 37 | 8 | 1 |
| 2 වන කාර්තුව | 32 | 47 | 12 | .. | 23 |
| 3 වන කාර්තුව | 38 | 17 | 5 | .. | 117 |
| 4 වන කාර්තුව | 100 | 96 | 4 | 1 | 201 |
| තිරිඟු | 709 | 771 | 826 | 1,057 | 913 |
| 1 වන කාර්තුව | 130 | 207 | 178 | 315 | 201 |
| 2 වන කාර්තුව | 154 | 226 | 259 | 213 | 303 |
| 3 වන කාර්තුව | 260 | 208 | 222 | 323 | 157 |
| 4 වන කාර්තුව | 165 | 130 | 168 | 206 | 252 |
| සීනි | 370 | 394 | 491 | 417 | 381 |
| 1 වන කාර්තුව | 68 | 146 | 127 | 133 | 94 |
| 2 වන කාර්තුව | 89 | 129 | 147 | 76 | 84 |
| 3 වන කාර්තුව | 128 | 78 | 134 | 95 | 58 |
| 4 වන කාර්තුව | 84 | 40 | 83 | 113 | 146 |
| ඛණිජ තෙල් (බොර තෙල්) | 1,297 | 1,791 | 1,898 | 1,860 | 2,033 |
| 1 වන කාර්තුව | 369 | 369 | 503 | 332 | 566 |
| 2 වන කාර්තුව | 312 | 553 | 547 | 452 | 493 |
| 3 වන කාර්තුව | 176 | 370 | 364 | 584 | 466 |
| 4 වන කාර්තුව | 439 | 498 | 484 | 492 | 508 |
| පොහොර | 340 | 465 | 427 | 452 | 361 |
| 1 වන කාර්තුව | 72 | 113 | 99 | 185 | 104 |
| 2 වන කාර්තුව | 103 | 108 | 159 | 97 | 60 |
| 3 වන කාර්තුව | 66 | 110 | 71 | 56 | 53 |
| 4 වන කාර්තුව | 99 | 134 | 97 | 115 | 144 |

(අ) ගලපන ලදී
(ආ) තාවකාලිකයි

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව
ලංකා පොහොර සමාගම සහ වෙනත් ප්‍රධාන පොහොර ආනයනයකරුවෝ
ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව

## අන්තර් භාණ්ඩ

මුළු ආනයන වලින් සියයට 50 කට දායක වන අන්තර් භාණ්ඩ ආනයනය, ඛණිජ තෙල් නිෂ්පාදනය වැඩිවීම (සියයට 30) පිළිබිඹු කරමින් සියයට 7 කින් වර්ධනය විය. එසේ වුවද පොහොර ආනයනය (සියයට 9) අඩුවීමක් වාර්තා කළේය. බොර තෙල් ආනයන ප්‍රමාණයෙහි හා මිලෙහි වැඩිවීම මෙන්ම වෙනත් ඛණිජ තෙල් නිෂ්පාදිතයින් ආනයනය වැඩිවීමද ඛණිජ තෙල් නිෂ්පාදන ආනයනයෙහි සැලකියයුතු වැඩිවීමකට හේතුවිය. 1995 වසරේදී කොලොන්නාවේ තෙල් ගබඩාවෙහි සිදු වූ ගින්නෙන් විනාශ වූ තොග නැවත පරිපූර්ණ කිරීමට සිදුවීම නිසා ආනයනය කරන ලද බොරතෙල් ප්‍රමාණය සියයට 9 කින්, මෙට්‍රික් ටොන් 2,033,000 ක් දක්වා වැඩිවිය. මෙයට අමතරව 1996 තෙල් පිරිපහදු කටයුතු සාමාන්‍ය ආකාරයට ක්‍රියාත්මක වීම, ලංකා විදුලිබල මණ්ඩලයෙහි විදුලි උත්පාදන යන්ත්‍ර සඳහා ඛණිජ තෙල් වැඩිපුර භාවිතා කිරීම සහ පෞද්ගලික අංශයේ විදුලිජනක යන්ත්‍ර භාවිතය වැඩිවීම පිළිබිඹු කරමින් ප්‍රධාන වශයෙන් බැර ඩීසල් හා දැවිතෙල් ඇතුලු පිරිපහදු කරන ලද ඛණිජ තෙල් ආනයනය මෙට්‍රික් ටොන් 838,000 දක්වා සියයට 34 කින් වැඩිවිය. ලෝක වෙළෙඳපොළෙහි ඛණිජ තෙල් තොග අඩු මට්ටමක පැවතිම හා ඉල්ලුම ඉහළ මට්ටමක පැවතිම හේතුකොට ලෝක වෙළෙඳපොළෙහි ඇති වූ උපනතීන් අනුව යමින් විශේෂයෙන් මෙම වසරෙහි තුන්වන කාර්තුවෙහි සිට බොර තෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල ඇ.එ.ජ. ඩොලර් 20.19 (මි.භා.ග.) දක්වා වැඩිවිය.

නියගය හේතුකොට පොහොර ආනයන ප්‍රමාණය සියයට 20 කින් අඩුවිය. එසේ වුවද පොහොර මිල සියයට 15 කින් ඉහළ ගිය අතර ආනයන වියදම් විගැ.ගි. දශලක්ෂ 5 කින් පහත වැටුණි. 1996 වසර තුළ රෙදිපිළි හා ඇඟළුම් අපනයනයෙහි පැවති උපනතීන් හා සමව යමින් රෙදිපිළි ආනයනය සියයට 6 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය.

## ආයෝජන භාණ්ඩ

1996 වසර තුළ ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 6 වැඩිවීමක් පෙන්නුම් කළේය. එයාර් ලංකා සමාගමේ ගුවන්යානා මිලයට ගැනීමේ වැඩපිළිවෙල යටතේ අවසන් වරට ආනයන කරන ලද ගුවන්යානයේ වටිනාකම බැහැර කළවිට (විගැගි දශලක්ෂ 68) ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 16 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. මෙම වැඩිවීම කෙරෙහි යන්ත්‍ර සූත්‍ර හා උපකරණ (සියයට 35 ක වැඩිවීමක්) යටතේ අඩංගුවන විදුලිජනක යන්ත්‍ර ආනයනය 1995 පැවති 2,006 සිට 1996 දී 13,386 දක්වා වැඩිවීමද තරමක් දුරට බලපෑවේය. 1996 ජුනි සිට මාස 7 ක කාලයක් සඳහා විදුලි ජනක යන්ත්‍ර සඳහා වූ ආනයන බදු මුළුමනින්ම ඉවත් කිරීම හා විදුලිබල මණ්ඩලය පෞද්ගලික අංශයේ විදුලිබල උත්පාදනයට අනුබල දීම සඳහා ප්‍රදානය කරන ලද බදු සහන හේතුකොට විදුලි උත්පාදන යන්ත්‍ර ආනයනය සැලකිය යුතු අන්දමින් වැඩිවිය. විදුලි සංදේශ අංශයෙහි කරන ලද ඉහළ විදේශ ආයෝජනය පිළිබිඹු කරමින් 1995 වර්ෂය තුළ ආනයන කරන ලද විදුලි සංදේශ හා සම්බන්ධ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ 1995 දී විගැගි දශලක්ෂ 11 සිට විගැගි දශලක්ෂ 34 දක්වා දෙගුණයකටත් වඩා වර්ධනය විය. මගී ප්‍රවාහණ ගාස්තු පාලනය කිරීම හේතුවෙන් ප්‍රවාහන අංශයෙහි ආයෝජනය අඩු ආකර්ෂණීය මට්ටමක පැවතීම මගී ප්‍රවාහන රථ ආනයනය සියයට 24 කින් අඩු වීමට හේතු විය.

## 9. 4 සේවා

1995 වර්ෂයේදී විගැගි දශලක්ෂ 10 ක අතිරික්තයක්ව පැවති සේවා ගිණුම 1996 වර්ෂය තුළදී සංචාරක ඉපැයීම් වල හා ආයෝජන ආදායම් අඩු වීම සහ විදේශීය ණය මත වූ පොලී ගෙවීම්වල වැඩි වීම නිසා විගැගි දශලක්ෂ 68 ක හිඟයක් බවට පත්විය. වර්ෂය තුල භාණ්ඩ ප්‍රතිනැව්ගත කිරීම සියයට 32 කින් වැඩිවීම නිසා 1996 දී වරාය සේවා ලැබීම් සියයට 23 කින් වැඩිවිය. රජයේ සේවා සහ වෙනත් සේවා ලැබීම් වල ද වැඩිවීම් වාර්තා විය. නාවික ගාස්තුවල සමස්ත අඩුවීම් පැවතිය ද ප්‍රවාහනය කරනු ලැබූ භාණ්ඩ ප්‍රමාණයෙහි සහ වෙළෙඳ නොවන රක්ෂණ ගාස්තුවල වැඩිවීම නිසා ප්‍රවාහණ හා වෙළෙඳ රක්ෂණ ගාස්තු ගෙවීම්වල වැඩිවීමක් වාර්තා විය.

1996 ජනවාරි මාසයේදී කොළඹ කොටුවේ බෝම්බ පිපිරීමෙන් පසුව වර්ෂයෙහි වැඩි කාළයක් තුල පසු බෑමකට පත්ව තිබූ ලංකාවේ සංචාරක කර්මාන්තය වර්ෂය අග භාගය වන විට මඳ වශයෙන් යථා තත්වයට පත්විය. 1995 දෙසැම්බර් මාසය හා සසඳන විට 1996 දෙසැම්බර් මාසය තුළ සංචාරක පැමිණීම් සියයට 12 කින් වර්ධනය විය. කෙසේ වුවද, 1996 වර්ෂය සමස්තයක් ලෙස ගත් කළ සංචාරක පැමිණීම් සියයට 25 කින් අඩුවූ අතර සංචාරක ව්‍යාපාරයෙන් වූ ලැබීම් ද ඊ හා සමාන ප්‍රමාණයක අඩු වීමක් පෙන්විය. වර්ෂය තුළ මගී ප්‍රවාහන ගාස්තු ලැබීම් සියයට 14 කින් අඩු විය. විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීම සහ අධ්‍යාපනික සහ විනෝද චාරිකා සඳහා විදේශ ගත වීම් බොහෝ දුරට 1995 වර්ෂයෙහි මට්ටමෙහිම පැවතීම නිසා සංචාරක ගෙවීම් විගැගි අගය අනුව ආන්තික වශයෙන් අඩු විය.

සංඛ්‍යා සටහන 9.6

ශුද්ධ සේවා සහ සංක්‍රාම

| ශීර්ෂය | විගැගි දශලක්ෂ | | රුපියල් දශලක්ෂ | |
|---|---|---|---|---|
| | 1995 | 1996 (අ) | 1995 | 1996 (අ) |
| 1. වරාය, ප්‍රවාහන හා රක්ෂණය | 88 | 94 | 6,082 | 7,541 |
| 2. සංචාර | 26 | 7 | 2,031 | 517 |
| 3. ආයෝජන ආදායම් | -90 | -139 | -6,958 | -11,154 |
| 3.1 ලාභ සහ ලාභාංශ | -46 | -43 | -3,599 | -3,473 |
| 3.2 පොලී | -43 | -96 | -3,358 | -7,682 |
| 4. රජයේ සේවා | -7 | -5 | -568 | -362 |
| 5. වෙනත් සේවා | -7 | -12 | -544 | -935 |
| මුළු සේවා | 10 | -68 | 763 | -5,427 |
| පෞද්ගලික සංක්‍රාම | 448 | 492 | 34,820 | 39,485 |
| නිල සංක්‍රාම | 114 | 106 | 8,896 | 8,515 |
| මුළු සංක්‍රාම | 562 | 598 | 43,716 | 48,000 |

(අ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව


පසුගිය වර්ෂ දෙක තුළ රටේ විදේශ වත්කම් විගැගි දශලක්ෂ 91 කින් අඩු වීම සහ 1996 වර්ෂය තුල විදේශීය පොලී අනුපාතිකයන්හි අඩුවීම පිළිඹිබු කරමින් ආයෝජන ආදායම් ලැබීම විගැගි දශලක්ෂ 27 කින් අඩු විය. මේ අතර ආයෝජන මණ්ඩලය යටතේ පවත්නා ව්‍යවසායයන් විදේශ මුදල් බැංකු ඒකක වලින් ලබා ගත් ණය ප්‍රමාණයෙහි වර්ධනය අඩුවීමේ තත්ත්වයන් යටතේ ඔවුන්ගේ නව ආයෝජනයන්ගෙන් කොටසක් සිය ලාභ නැවත ආයෝජනය කිරීම තුලින් මූල්‍යනය කිරීම නිසා වර්ෂය තුළ පොලී සහ ලාභාංශ වශයෙන් පිටතට ගලායෑම් වල සියයට 6 ක අඩුවීමක් පෙන්විය. මෙම තත්ත්වයන්හි සමස්ත ප්‍රතිඵලය වූයේ සේවා ලැබීම් සියයට 6 කින් අඩු වීමත් සේවා ගෙවීම් සියයට 6 කින් වැඩිවීමත් මගින් සේවා ගිණුමෙහි හිගයක් ඇතිවීමය.

## 9.5 සංක්‍රාම

නිල සහ පෞද්ගලික සංක්‍රාම යන දෙකෙන්ම සමන්විත වූ ශුද්ධ සංක්‍රාම වර්ෂය තුලදී සියයට 6 කින් වැඩි වී විගැගි දශලක්ෂ 598 ක් විය. වර්ෂය තුල පෞද්ගලික සංක්‍රාම ලැබීම් සහ ගෙවීම් දෙකෙහිම වැඩිවීමක් පැවති අතර නිල සංක්‍රාම ලැබීම් විගැගි දශලක්ෂ 106 දක්වා පහත වැටුණි. ජපානය (සියයට 37) සහ නෝර්වේ (සියයට 31) නිල සංක්‍රාම ලබා දුන් ප්‍රධාන රටවල් විය. මෙම ආධාර වලින් සියයට 70 ක් පමණ ව්‍යාපෘති ආධාර වශයෙන් ලැබුණි. රැකියා සඳහා විදේශ ගතවූවන් විසින් සිය පවුල්වල නඩත්තුව සඳහා එවනු ලබන ප්‍රේෂණ වල වර්ධනයක් පිළිඹිබු කරමින් පෞද්ගලික සංක්‍රාම ලැබීම් සියයට 10 කින් වැඩිවී විගැගි දශලක්ෂ 579 ක් විය. විදේශයන්හි පදිංචිය සඳහා යන ශ්‍රී ලාංකිකයන්ට නිදහස්කරණ වැඩපිළිවෙල යටතේ ගෙන යාමට අවසර දෙනු ලබන සංක්‍රමණික දීමනා 1993 සිට වැඩිකිරීම ආංශික වශයෙන් පිළිඹිබු කරමින් පෞද්ගලික සංක්‍රාම ගෙවීම් වර්ෂය තුළදී සියයට 11 කින් වැඩි විය. 1996 ජාතික ඉතුරුම්වලට සංක්‍රාමවලින් වූ දායකත්වය සියයට 27 විය.

## 9.6 ප්‍රාග්ධන සංචලන

පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම් වල වර්ධනයක් පැවතියදීත් ආයෝජන වාතාවරණයෙහි එතරම් සතුටුදායක තත්වයක් නොපැවතීම නිසා ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් 1995 දී විගැගි දශලක්ෂ 399 සිට 1996 දී විගැගි දශලක්ෂ 271




දක්වා අඩු වෙමින් ප්‍රාග්ධන ගිණුමෙහි පිරිහීමක් පෙන්නුම් කළේය. මෙයට මූලික වශයෙන් හේතුවූයේ ආරක්ෂක වියදම් හා සම්බන්ධ වෙළෙඳ ණය ආපසු ගෙවීම් ආංශික වශයෙන් පිළිබිඹු කරමින් රජයට ලැබුණ සහනදායී නොවන ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් වල අඩුවීමය. මුළු ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම්, ජංගම ගිණුමෙහි හිඟයෙන් සියයට 72 ක් මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වූ අතර ගෙවුම් ශේෂයෙහි සමස්ත හිඟය විගැහි දශලක්ෂ 63 ක් විය.

## දිගු කාලීන ප්‍රාග්ධන

දිගුකාලීන පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම් වල වර්ධනයක් වාර්තා වුවද, 1996 වර්ෂය තුල දිගුකාලීන ප්‍රාග්ධන ගලාඒම් විගැහි දශලක්ෂ 537 ක් දක්වා සියයට 15 කින් අඩු විය. රජය වෙත ගලා ආ දිගුකාලීන ප්‍රාග්ධන වර්ෂය තුලදී සියයට 27 කින් අඩු වූ අතර මෙයට මූලික වශයෙන් හේතු වූයේ 1995 වසර හා සසඳන විට 1996 වර්ෂය තුල දී ආරක්ෂක වියදම් හා සම්බන්ධ සහනදායී නොවන ණය වල අඩු වීමය. මේ අතර, සහනදායී ණය ලැබීම් 1995 විගැහි දශලක්ෂ 295 සිට 1996 දී විගැහි දශලක්ෂ 293 දක්වා ආන්තික වශයෙන් අඩුවිය. අතීතයේදී මෙන්ම 1996 වර්ෂයේදී ද ආසියානු සංවර්ධන බැංකුව (විගැහි දශලක්ෂ 103), ජපානය (විගැහි දශලක්ෂ 98), සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (විගැහි දශලක්ෂ 71) රජයට සහනදායී ණය ලබා දුන් ප්‍රධාන මූලයන් විය.

දේශීය ආයෝජන වාතාවරණය පිළිබඳ දැනීමකින් යුත් පෞද්ගලික විදේශ ආයෝජකයින් ඔවුන්ගේ ආයෝජන තීරණ ගැනීමේදී ආරක්ෂක තත්ත්වය සම්බන්ධව මනා අවබෝධයකින් යුක්තව ක්‍රියා කළ බව දක්නට ලැබුණි. 1995 දී විගැහි දශලක්ෂ 10 ක් වූ ශුද්ධ සෘජු විදේශ ආයෝජන 1996 දී විගැහි දශලක්ෂ 60 ක් දක්වා ආකර්ෂණීය ලෙස වැඩිවීම තුලින් මෙය පෙන්නුම් කෙරිණි. මෙය ප්‍රධාන වශයෙන් ලංකා බැංකුව විදේශ ශාඛා විවෘත කිරීම වෙනුවෙන් කරන ලද ආයෝජනද ඇතුලත් වූ විගැහි දශලක්ෂ 9 ක ආයෝජන ගලායාම් අඩු කළ පසු පැවති තත්ත්වය විය. මේ අතර ඔරියන්ට් ලංකා පෞද්ගලික සමාගම (විගැහි දශලක්ෂ 13) සහ ලංකා වානේ සංස්ථා සමාගම (විගැහි දශලක්ෂ 10) සංස්ථාපිත විදේශීය ආයෝජකයන් වෙත අලෙවි කිරීම තුලින් ලැබූ විගැහි දශලක්ෂ 23 ක්වූ පෞද්ගලීකකරණ ලැබීම් ද ගෙවුම් ශේෂයෙහි සමස්ත හිඟය ඉහළ යාම වළක්වා ගැනීමට හිතකර ලෙස දායක විය.

පෞද්ගලික දිගුකාලීන ශුද්ධ ණය ගලා ඒම් 1995 දී විගැහි දශලක්ෂ 49 සිට 1996 දී විගැහි දශලක්ෂ 2 දක්වා අඩු වූ අතර මෙයට මූලික වශයෙන් හේතු වූයේ එයාර් ලංකා ආයතනයෙහි අභ්‍යවකාශ ප්‍රතිසම්පාදන වැඩ පිළිවෙළ සඳහා වූ මූල්‍ය විධිවිධාන නිමා වීම, විදේශ මුදල් බැංකු ඒකක මගින් ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන් සඳහා දෙනු ලැබූ ණය ප්‍රමාණයෙහි අඩුවීම සහ කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීම සඳහා හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගම කලින් ලබාගත් ණය ආපසු ගෙවීමත්ය. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විදුලි පණිවුඩ මාර්ග පද්ධති සැපයීම, ස්ථාපනය කිරීම සහ විදුලි සංදේශ පහසුකම් තවදුරටත් පුළුල් කිරීම සඳහා ත් (විගැහි දශලක්ෂ 90), සංවර්ධන බැංකු දෙක මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති සඳහා දිගුකාලීන ණය සැපයීම සඳහා ත් (විගැහි දශලක්ෂ 29), ගිවිසගනු ලැබූ දිගුකාලීන ණය වෙනුවෙන් ලැබුණු විගැහි දශලක්ෂ 67 ක මුදල් ප්‍රමාණය ප්‍රාග්ධන ගලාඒම් සඳහා වූ හිතකර වර්ධනයන් විය. මේ අතර, විදේශ මුදල් බැංකු ඒකක වලින් ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන් සඳහා ණය වශයෙන් පසුගිය වර්ෂයේදී ලැබුණු විගැහි දශලක්ෂ 47 හා සසඳන විට 1996 දී එය විගැහි දශලක්ෂ 37 දක්වා පහත වැටුණි.

## කෙටිකාලීන ප්‍රාග්ධන

කෙටිකාලීන ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් විගැහි දශලක්ෂ 16 සිට 1996 දී විගැහි දශලක්ෂ 30 දක්වා වැඩිවුණි. මෙය වර්ෂය තුළ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙහි කෙටිකාලීන ණය ලබා ගැනීම් වැඩි වීම, කොටස් වෙළෙඳපොල ආයෝජන ශුද්ධ ගලාඒමක් බවට පත්වීම, ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන් විදේශ මුදල් බැංකු ඒකක වලින් ලබාගත් ණය අඩුවීම සහ ආයෝජන මණ්ඩලය යටතේ ඇති ආයතන මෙන්ම ඉන් පිට ආයතනවල වෙළෙඳ ණය ගැනීම් අඩුවීම යනාදියෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. 1995 වර්ෂයෙහි අග භාගයේදී තෙල් ගබඩාවලට හානිවීම නිසා තෙල් තොග විනාශ වීම සහ 1996 දී ජල විදුලි බල හිඟයට පිළියම් වශයෙන් තාප බල උත්පාදන වැඩිවීම ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ආනයන අවශ්‍යතා විශාල වශයෙන් වැඩිවීමට හේතුවිය. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විදේශ මුදල් බැංකු ඒකක වලින් සහ එයින් පිටස්තර මූලයන් මගින් කෙටිකාලීන ණය ලබා ගැනීම් වල ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසරෙහි පැවති විගැහි දශලක්ෂ 10 ක ශුද්ධ ණය ආපසු ගෙවීම හා සසඳන විට 1996 දී එය විගැහි දශලක්ෂ 24 ක ශුද්ධ ණය ලබාගැනීම ක් විය. මේ අතර, විදුලි බල අර්බුදය නිසා ආර්ථික කටයුතුවල වසරේ මුල් මාස 9 තුල වැඩි වර්ධනයක් නොපැවතීමේ හේතුවෙන් අන්තර් සහ ආයෝජන භාණ්ඩ ආනයනයෙහි අඩු වර්ධනයක් පැවතීම නිසා වසරේ මුල් කාලයේදී ආයෝජන මණ්ඩල සහ ආයෝජන මණ්ඩල නොවන ව්‍යවසායයන් වලින් කෙටි කාලීන වෙළෙඳ ණය සඳහා පැවති ඉල්ලුම අඩු විය. ආයෝජන මණ්ඩලය යටතේ පවත්නා ව්‍යවසායයන් වල විදේශ බැංකු ශේෂයන්හි වැඩිවීම තවදුරටත් සිදුවිය.

කොටස් වෙළෙඳ පොල ආයෝජන වශයෙන් කෙටිකාලීන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් වර්ෂය තුලදී ආන්තික වශයෙන් වැඩි වූ නමුත් කොටස් මිළ දර්ශකයන් ඉහළ මට්ටමක පැවති 1990 ගණන්වල මුල් භාගයේ තත්ත්වය හා සසඳන විට එය සැළකිය යුතු පහල මට්ටමක පැවතුණි. කොළඹ කොටස් වෙළෙඳපොලෙහි විදේශීය සහභාගීත්වය අඩු මට්ටමක පැවති අතර එය අවිනිශ්චිත ආරක්ෂක තත්ත්වය, කම්කරු නොසන්සුන්තාව සහ බලශක්ති හිඟතාවය යනාදිය නිසා කාර්මික නිෂ්පාදිත සහ සමාගම් ලාභ වලට ඇතිවූ අයහපත් බලපෑම හේතුවෙන් කොළඹ කොටස් වෙළඳපොලෙහි වර්ෂය තුලදී කොටස් මිළ ගණන් පහත බැසීමේ තත්ත්වය තුලින් පිළිබිඹු විය. විශේෂයෙන්

**සංඛ්‍යා සටහන 9.7**
**විනිමය අනුපාතික වෙනස්වීම්**

| මුදල් වර්ගය | විදේශීය මුදල් ඒකකයට රුපියලේ අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශත වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍ය | | | ලක්ෂමය | | වාර්ෂික සාමාන්‍ය | |
| | 1994 | 1995 | 1996 | 1994 | 1995 | 1996 | 1995/1994 | 1996/1995 | 199541994 | 199641995 |
| පර්මන් මාර්ක් | 32.16 | 37.76 | 36.46 | 30.45 | 35.81 | 36.75 | -14.8 | 3.6 | -15.0 | 2.5 |
| ප්‍රංශ ප්‍රෑන්ක් | 9.32 | 11.05 | 10.81 | 8.90 | 10.27 | 10.81 | -15.7 | 2.2 | -13.3 | -5.0 |
| ඉන්දියානු රුපියල් | 1.59 | 1.54 | 1.58 | 1.58 | 1.58 | 1.56 | 3.1 | -2.5 | -0.5 | 1.4 |
| ජපන් යෙන් | 0.50 | 0.53 | 0.49 | 0.48 | 0.55 | 0.51 | -4.8 | 7.6 | -11.7 | 7.7 |
| බ්‍රිතාන්‍ය පවුම් | 78.05 | 84.25 | 95.86 | 75.68 | 80.88 | 86.34 | -7.4 | -12.1 | -6.4 | -6.3 |
| එ.ජ. ඩොලර් | 49.98 | 54.05 | 56.71 | 49.42 | 51.25 | 55.27 | -7.5 | -4.7 | -3.6 | -7.3 |
| විශේෂ ගැනුම් හිමිකම් | 72.76 | 80.39 | 81.38 | 70.75 | 77.74 | 80.23 | -9.5 | -1.2 | -9.0 | -3.1 |

(අ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාල විදේශීය ව්‍යවහාර මුදල් ඒකකයක වටිනාකම් පදනම් කර ගෙනය. ඍණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම පෙන්නුම් කරයි

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව

යුරෝපා රටවල් බොහොමයක සහ ඇමරිකා එකසත් ජනපදයෙහි ඇතිවූ තාක්ෂණික දියුණුව තුලින් ආර්ථික මූලිකාංගවල ඇති වූ දියුණුව එම රටවල කොටස් මිළ ඉහළ යාමට හිතකර තත්ත්වයන් ලබා දුන් අතර එමගින් විදේශීය ආයෝජන ආසියානු කලාපයෙන් ඉවතට ගලායාම කොටස් වෙළෙඳපල ආයෝජන අඩුවීම කෙරෙහි බලපානු ලැබිය.

## 9.7 විනිමය අනුපාතික සංචලනයන්

1995 දෙසැම්බර් සිට 1996 දෙසැම්බර් මස අග කාලය අතර දී ශ්‍රී ලංකා රුපියල එහි මැදිහත් වීමේ මුදල් ඒකකය වන ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 4.7 කින්ද විගැහි වලට සාපේක්ෂව සියයට 1.2 කින්ද අවප්‍රමාණය විය. විගැහි වලට සාපේක්ෂව රුපියලෙහි අවප්‍රමාණය වීම අඩු මට්ටමක පැවතීම වර්ෂය තුලදී ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරය ජාත්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපල තුල බ්‍රිතාන්‍ය පවුම හැර අනිකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ග වලට සාපේක්ෂව අධිප්‍රමාණය වීමෙහි ප්‍රතිඵලයක් විය.


ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරය ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ග වලට සාපේක්ෂව වෙළෙඳ බර තැබූ පදනමක් මත සියයට 3.6 කින් අධිප්‍රමාණය විය: ලංකාවේ වෙළෙඳ හවුල්කරුවන් හා තරගකරුවන් සමග වූ නාමික සඵල විනිමය අනුපාත දර්ශකය 1996 වර්ෂය තුලදී සියයට 3.9 කින් අවප්‍රමාණය විය. විනිමය අනුපාතිකය නාමික වශයෙන් අවප්‍රමාණය වීම තුලින් ලංකාවේ සහ එහි වෙළෙඳ හවුල්කරුවන් සහ තරගකරුවන් අතර පැවති උද්ධමනයෙහි වෙනස සම්පූර්ණයෙන්ම ආවරණය නොවීම නිසා මූර්ත සඵල විනිමය අනුපාත දර්ශකය සියයට 6.6 කින් අධිප්‍රමාණය විය. මෙම තත්ත්වයට විශාල වශයෙන් හේතු වූයේ ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරය ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ග රාශියකට සාපේක්ෂව අධිප්‍රමාණය වීමක් ඇති කරමින් 1996 වර්ෂය තුල ජාත්‍යන්තර විනිමය අනුපාතිකයන්හි පැවති සංචලනය වීමයි.

## 9.8 විදේශීය වත්කම්


ශ්‍රී ලංකාවේ දළ විදේශීය වත්කම් 1995 අවසානයේ විගැහි දශලක්ෂ 1,729 සිට 1996 අවසානයේ විගැහි දශලක්ෂ 1,701 දක්වා සියයට 2 කින්

**රූප සටහන 9.6**
**සඵල විනිමය අනුපාතික**
**(1990=100)**

රූප සටහන 9.6.1
නාමික සඵල විනිමය අනුපාතිකය




රූප සටහන 9.6.2
මූර්ත සඵල විනිමය අනුපාතිකය




ආන්තික වශයෙන් අඩු විය. මෙම අඩු වීම, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි විදේශීය වත්කම් විගැහි දශලක්ෂ 1,334 දක්වා සියයට 3 කින් අඩුවීම, වාණිජ බැංකුවල විදේශීය වත්කම් විගැහි දශලක්ෂ 351 දක්වා සියයට 3 කින් වැඩිවීම සහ රජය සතු විදේශීය වත්කම් විගැහි දශලක්ෂ 16 දක්වා විගැහි දශලක්ෂ 4 කින් වැඩිවීමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. ශ්‍රී ලංකා මහ බැංකුව හා රජය සතු විදේශීය වත්කම් වලින් සමන්විත දළ නිල සංචිත වර්ෂ දෙක අතරදී විගැහි

**සංඛ්‍යා සටහන 9.8**
**ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම්**

| ශීර්ෂය | විගැ.ශි. දශලක්ෂ (අ) | | | | | රුපියල් දශලක්ෂ (අ) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994 | 1995 | 1996 | 1992 | 1993 | 1994 | 1995 | 1996 |
| 1. රජය (ආ) | 23 | 23 | 19 | 12 | 16 | 1,482 | 1,597 | 1,132 | 938 | 1,295 |
| 2. රාජ්‍ය නියෝජිතත්ව | ... | ... | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 |
| 3. මහ බැංකුව (ඇ) | 658 | 1,194 | 1,373 | 1,375 | 1,334 | 41,592 | 81,404 | 99,859 | 110,521 | 108,506 |
| 4. වෙළෙඳ බැංකු | 366 | 326 | 403 | 341 | 351 | 23,161 | 22,256 | 29,349 | 27,446 | 28,549 |
| 5. එකතුව | 1,047 | 1,544 | 1,792 | 1,729 | 1,701 | 66,236 | 105,258 | 130,340 | 138,905 | 138,349 |
| 6. දළ විදේශීය සම්පත් මගින් කළ හැකි ආනයන - මාස ගණන | | | | | | | | | | |
| 6.1 වෙළෙඳ භාණ්ඩ | 5.1 | 6.5 | 6.5 | 5.9 | 5.5 | | | | | |
| 6.2 භාණ්ඩ හා සේවා | 4.2 | 5.5 | 5.5 | 5.0 | 4.6 | | | | | |


මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව


(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකගවන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්තනය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තරසංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සදහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයින්ට අනුව පරිවර්තනය කර ඇත.

| වර්ෂය | 1992 | 1993 | 1994 | 1995 | 1996 |
|---|---|---|---|---|---|
| විගැශි 1 කට රුපියල් | 63.33 | 68.19 | 72.76 | 80.39 | 81.38 |

(ආ) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමින් ඇති ගිණුමේ හර ශේෂයන් ඇතුලත් කිරීම සදහා 1985 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

(ඇ වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තැන්පත් කර ඇති, විදේශ මුදල් ගිණුම්වලට අදාල මුදල් සංචිත ඇතුලත් කිරීම සදහා 1993 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.




දශලක්ෂ 1,387 සිට විගැශි දශලක්ෂ 1,350 දක්වා අඩු විය. 1996 වර්ෂය අවසානයේදී පැවති දළ විදේශීය වත්කම් 1997 සදහා ඇස්තමේන්තු කරන ලද මාස 4.8 ක ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වූ අතර දළ නිල සංචිත ප්‍රමාණය මාස 3.8 ක ආනයන මූල්‍යනය කිරීම සදහා ප්‍රමාණවත් විය.

## 9.9 විදේශීය ණය

විගැශි දශලක්ෂ 82 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකාවේ විදේශීය ණය වර්ෂය අවසානය වන විට විගැශි දශලක්ෂ 6,416 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම වැඩිවීම, පසුගිය වසර 5 ක කාළය තුල වාර්තා වූ අඩුම ප්‍රමාණය වූ අතර එය ජාත්‍යන්තර සංවර්ධන සමායතනය, ආසියානු සංවර්ධන බැංකුව සහ ජපානය මගින් සහනදායී ආධාර වශයෙන් ලබා දුන් මැදි සහ දිගුකාලීන ණය තුලින් පිළිඹිබු විය. මැදි සහ දිගුකාලීන ණය 1995 වර්ෂය අවසානයේදී විගැශි දශලක්ෂ 5,609 සිට 1996 වර්ෂය අවසානයේදී විගැශි දශලක්ෂ 5,665 දක්වා වැඩිවිය. මෙයින් රජයේ ණය සියයට 80 ක් විය. මේ අතර ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සහ ජාතික සංවර්ධන බැංකුව මගින් ලබා ගත් ණය වල වැඩි වීම පෙන්නුම් කරමින් රජය සහතික කරන ලද රාජ්‍ය සංස්ථා ණය විගැශි දශලක්ෂ 395 දක්වා වැඩි විය. කොළඹ හිල්ටන් හෝටලයෙහි අයිතිකරුවන් වූ හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගම විසින් කරනු ලැබූ ණය ආපසු ගෙවීමක් හේතුවෙන් රජය සහතික කළ, පෞද්ගලික අංශය විසින් ලබා ගත් ණය වලින් නොගෙවා ඉතිරි වූ ප්‍රමාණය මෙම කාලය තුලදී විගැශි දශලක්ෂ 157 සිට විගැශි දශලක්ෂ 140 දක්වා අඩු විය. මේ අතර, රජයේ සහතික කිරීමක් නොමැති පෞද්ගලික අංශයේ ණය වලින් නොගෙවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය වසර දෙක ඇතුලත විගැශි දශලක්ෂ 249 සිට විගැශි දශලක්ෂ 252 දක්වා වැඩිවිය.

## සංඛ්‍යා සටහන 9.9
## නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

| ශීර්ෂය | වි.ගැ.හි. දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) |
| 1. මැදි හා දිගු කාලීන ණය | 4,624 | 5,060 | 5,384 | 5,609 | 5,665 | 289,679 | 345,083 | 391,714 | 450,040 | 460,057 |
| 1.1 රජයේ | 3,841 | 4,123 | 4,214 | 4,425 | 4,509 | 243,251 | 281,142 | 306,615 | 355,736 | 366,946 |
| 1.2 රජයේ ඇප සහිත රාජ්‍ය සංස්ථා | 176 | 246 | 349 | 376 | 395 | 11,121 | 16,804 | 25,414 | 30,210 | 32,113 |
| 1.3 රජයේ ඇප සහිත පෞද්. අංශය | 129 | 144 | 159 | 157 | 140 | 8,173 | 9,821 | 11,576 | 12,645 | 11,404 |
| 1.4 රජයේ ඇප රහිත රාජ්‍ය සංස්ථා | 2 | 1 | 1 | 1 | 1 | 151 | 97 | 95 | 96 | 90 |
| 1.5 රජයේ ඇප රහිත පෞද්. අංශය | 139 | 170 | 237 | 249 | 252 | 8,784 | 11,566 | 17,281 | 20,006 | 20,471 |
| 1.6 ජා.මු.අ.න් කළ ගැණුම් | 338 | 376 | 422 | 401 | 369 | 18,199 | 25,653 | 30,734 | 31,347 | 29,033 |
| 2. කෙටි කාලීන ණය | 421 | 526 | 707 | 725 | 751 | 24,579 | 31,689 | 44,619 | 58,301 | 61,121 |
| 2.1 රජය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2.2 මහ බැංකුවේ ණය ගැනීම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2.3 අනෙකුත් (ආ) | 421 | 526 | 707 | 725 | 751 | 24,579 | 31,689 | 44,619 | 58,301 | 61,121 |
| 3. මුළු ණය (1 + 2) | 5,045 | 5,586 | 6,091 | 6,334 | 6,416 | 314,257 | 376,772 | 436,333 | 508,341 | 521,177 |
| 4 විශේෂිත අයිතමයන් මැදි හා දිගු කාලීන ණය | | | | | | | | | | |
| 1 ව්‍යාපෘති ණය | 2,556 | 2,711 | 2,891 | 3,103 | 3,187 | 161,873 | 184,859 | 210,354 | 242,585 | 259,355 |
| 2 ව්‍යාපෘති නොවන ණය | 1,251 | 1,305 | 1,239 | 1,262 | 1,126 | 79,234 | 88,984 | 90,147 | 93,224 | 91,667 |
| 3 සැපයුම් කරුවන්ගේ ණය | 61 | 119 | 111 | 172 | 174 | 3,873 | 8,087 | 8,051 | 13,837 | 14,136 |
| 4 ජා.මු.අ. ණය | 338 | 376 | 422 | 401 | 369 | 18,199 | 25,653 | 30,734 | 31,347 | 29,033 |
| 5 අනෙකුත් ණය (ඇ) | 418 | 550 | 721 | 671 | 809 | 26,499 | 37,500 | 52,429 | 69,047 | 65,866 |

(අ) තාවකාලික
(ආ) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය , වෙළෙඳ ණය, සහ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ගිමින්ගෙන් ලබා ගත් කෙටි කාලීන ණය ඇතුලත් වේ.
(ඇ) රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගු කාලීන ණය

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

## සංඛ්‍යා සටහන 9.10
## ණය සේවා ගෙවීම්

| ශීර්ෂය | වි.ගැ.හි. දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) |
| 1. ණය සේවා ගෙවීම | 382 | 357 | 379 | 444 | 526 | 23,671 | 24,066 | 26,734 | 33,570 | 42,045 |
| 1.1 ණය ආපසු ගෙවීම් | 231 | 213 | 214 | 262 | 319 | 14,329 | 14,317 | 15,012 | 19,398 | 25,355 |
| (i) ජා.මු. අරමුදලට | 54 | 18 | 9 | 22 | 31 | 3,359 | 1,119 | 616 | 1,184 | 2,314 |
| (ii) අනෙකුත් | 177 | 195 | 205 | 239 | 287 | 10,969 | 13,198 | 14,396 | 18,214 | 23,041 |
| 1.2 පොලී ගෙවීම් | 151 | 144 | 165 | 182 | 208 | 9,342 | 9,750 | 11,723 | 14,172 | 16,691 |
| (i) ජා.මු. අරමුදලට | 8 | 5 | 5 | 5 | 5 | 481 | 363 | 348 | 407 | 409 |
| (ii) අනෙකුත් | 144 | 138 | 160 | 177 | 203 | 8,862 | 9,387 | 11,374 | 13,765 | 16,282 |
| 2. වෙළෙඳ භාණ්ඩ අපනයනය හා සේවාවන්ගේ ඉපැයීම | 2,234 | 2,581 | 2,862 | 3,192 | 3,470 | 138,111 | 174,224 | 202,917 | 248,579 | 278,854 |
| 3. වෙළෙඳ භාණ්ඩ අපනයන සේවා හා පෞද්ගලික සංක්‍රාම | 2,623 | 3,035 | 3,361 | 3,718 | 4,050 | 162,148 | 204,815 | 238,262 | 289,470 | 325,321 |
| 4 ණය සේවා අනුපාතික (ආ) | | | | | | | | | | |
| 4.1 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ථ අනුපාතිකය | 17.1 | 13.8 | 13.3 | 13.9 | 15.2 | 17.1 | 13.8 | 13.2 | 13.5 | 15.1 |
| (ii) ජා.මු. අරමුදලේ ගනුදෙනු හැර | 14.3 | 12.9 | 12.8 | 13.1 | 14.1 | 14.4 | 12.9 | 12.7 | 12.9 | 14.1 |
| 4.2 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ථ අනුපාතිකය | 14.6 | 11.8 | 11.3 | 11.9 | 13.0 | 14.6 | 11.8 | 11.2 | 11.6 | 12.9 |
| (ii) ජා.මු. අරමුදලේ ගනුදෙනු හැර | 12.2 | 11.0 | 10.9 | 11.2 | 12.1 | 12.2 | 11.0 | 10.8 | 11.0 | 12.1 |
| 5. රජයේ ණය සේවා ගෙවීම් (ඇ) | 206 | 222 | 223 | 230 | 254 | 12,713 | 14,934 | 15,749 | 17,888 | 20,364 |
| 5.1 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 54 | 62 | 59 | 52 | 48 | 51 | 62 | 59 | 53 | 48 |

(අ) තාවකාලික
(ආ) වර්ෂය තුළ විනිමය අනුපාතිකයන්හි සිදුවූ වෙනස්වීම් හේතුවෙන්, රුපියල් වටිනාකම හා විගැහි වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගත් කළ ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.
(ඇ) ජා. මු. අරමුදලෙයි ගනුදෙනු හැර

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව

**විශේෂ සටහන 9**

# ගෙවුම් තුලනය - නව ඉදිරිපත් කිරීම

ආර්ථිකයක සෙසු ලෝකයත් සමග පවත්නා ආර්ථිකමය ගනුදෙනු යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා ක්‍රමානුකූලව සාරාංශ කරන ලද සංඛ්‍යාත්මක ප්‍රකාශනයක් ලෙස ගෙවුම් තුලනය නිර්වචනය කර ඇති අතර එය නේවාසික සහ අනේවාසික දෙපාර්ශ්වය අතර වැඩි වශයෙන්ම සිදුවන භාණ්ඩ, සේවා සහ ආදායම් සම්බන්ධිත ගනුදෙනු වලින් ද බාහිර ලෝකය හා සම්බන්ධ මූල්‍ය අයිතීන් සහ වගකීම් වල වෙනස්වීම් වලින් ද ගිණුම්කරණ අර්ථයට අනුව ඒක පාර්ශවයීය ගනුදෙනු ලෙස සැළකෙන එකිනෙකට හිලව් වී තුලනය වන ගනුදෙනු හා සම්බන්ධ වන සංක්‍රාම වශයෙන් වර්ගීකරණය කර ඇති (ත්‍යාගවැනි) ඒවායින් ද සමන්විත වේ.[1] ගනුදෙනුවක් යන්න, යම් ආර්ථික ක්‍රියාවලියකින් පිළිබිඹුවන නව බිහිවීමක්, පවත්නා වදයක් යම් පරිවර්තනයකට පත්වීමක්, හුවමාරුවීමක්, පැවරීමක් හෝ පවත්නා ආර්ථික වටිනාකමක් නැතිවීයාමක් වශයෙන් නිර්වචනය කර ඇති අතර එයට භාණ්ඩ සහ / හෝ මූල්‍ය වත්කම්වල හිමිකාරත්වය වෙනස්වීම්, සේවා සැපයීම හෝ ශ්‍රමය සහ ප්‍රාග්ධනය සැපයීම සම්බන්ධ වේ.

ප්‍රතිපත්ති සැකසීම, ප්‍රතිපත්තිවලින් ලැබෙන ප්‍රතිඵල නිරීක්ෂණය කිරීම, පුරෝකථනය කිරීම, මූර්ත සහ මූල්‍ය වෙළෙඳපොළ වල අන්තර් ක්‍රියා විමර්ශණය කිරීම සහ අධ්‍යාපනික පර්යේෂණ ඇතුලුව විවිධ කරුණු සම්බන්ධයෙන් ආර්ථිකමය විමර්ශණයන් කිරීමට අවස්ථාව සලසාදීම සඳහා ගෙවුම් ශේෂය පිළිබඳ සංඛ්‍යා ඒකාබද්ධ රාමුවක් තුළ සකස් කිරීම අවශ්‍ය වේ. යම් ඒකීය හා සම්මත ආකෘතියකට අනුව ගෙවුම් තුලන දත්ත ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය මේ නිසා ඇති වේ. සියළුම රටවල් යම් සම්මත ප්‍රමිතියකට අනුව දත්ත ඉදිරිපත් කිරීම යම් දී ඇති පාඨයක් හෝ සංකල්පයක්, එක සමාන අර්ථයක් ඇති පරිදි හා රටවල් අතර සන්සන්දනය කිරීම් පහසුකරලන පරිදි පොදු භාෂාවක් කථා කිරීම හා සමානව සැළකිය හැකිය.

වර්තමානයේ, ලංකාවේ ගෙවුම් තුලන සංඛ්‍යා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගෙවුම් තුලන අත්පොතෙහි (Blance of Payments Manual 4) (ගෙතුඅ 4) හතරවැනි සංස්කරණයට (1977) අනුව සකස් කර, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි වාර්ෂික වාර්තාවෙහි සහ මාසික විවරණිකාවන්හි පළ කරනු ලැබේ. ගෙවුම් තුලන අත්පොත සකස් කර ඇත්තේ එක්සත් ජාතීන්ගේ ජාතික ආදායම් ගිණුම් ක්‍රමය (Systems of National Accounts)[2] අනුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සාමාජික රටවල අවශ්‍යතා සහ ඔවුන්ගේ අදහස් පිළිබිඹුවීම සඳහා එම රටවල ජාතික ගෙවුම් තුලන සංඛ්‍යා සකස් කරන්නන්ගේ ද අදහස් විමසීමෙනි. එසේ සම්මත ප්‍රමිතියකට අනුව සකස් කරන ලද ආකෘතියක් 1 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති අතර, සංඛ්‍යාලේඛන පරිශිෂ්ටයෙහි 91 වැනි සංඛ්‍යා සටහනෙහි ද දක්වා ඇත.

1977 දී ගෙතුඅ 4 ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව විශේෂයෙන් වෙළෙඳ හා සේවාවල වර්ධනයන් සහ මූල්‍ය අංශයෙහි නව ප්‍රවණතාවයන් මගින් ඇති වූ සීඝ්‍ර වර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස ගෙවුම් තුලන ප්‍රමිතීන්හි ප්‍රති-අවධාරණය කිරීම, ප්‍රති-වර්ගීකරණය කිරීම හා ප්‍රති-නිර්වචනය කිරීම අත්‍යවශ්‍ය වී ඇත. රටවල් රාශියකම ඇති වූ වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණයන් මගින් වෙළෙඳ අවහිරතා සහ ප්‍රාග්ධන පාලනය කිරීම් බොහොමයක් ලිහිල් කිරීම සහ ආර්ථික කටයුතු ජාත්‍යන්තරකරණය කිරීම තීව්‍ර කර ඇත. දශක කිහිපයකට පෙර රටවල්වල පැවති බරගු අවහිරතාවයන් මධ්‍යයේ කරනු ලැබූ සම්ප්‍රදායික ආනයන සහ අපනයනයන් හා සසඳන විට, ප්‍රති-අපනයනය කිරීමේ අරමුණ මත සැකසීම සහ අළුත්වැඩියා කිරීම සඳහා වූ භාණ්ඩද වර්තමානයේ දී රටවල්වලට ගෙන එනු ලැබේ. අතීතයේ දී නොපැවති හෝ නොවැදගත් ලෙස සලකනු ලැබූ සන්නිවේදන, ඉදිකිරීම්, පරිගණක සේවා, ස්වාධිකාර සහ බලපත්‍ර ගාස්තු සහ පෞද්ගලික, සංස්කෘතික සහ විනෝදාස්වාදය ලබාදෙන සේවාවන් යනාදිය හා සම්බන්ධිත සේවා වෙළදාම වර්තමානයෙහි වැදගත් තැනක් හිමිකරගෙන ඇත.

ජාත්‍යන්තර ණය අර්බුදයට විසඳුම සෙවීම් සඳහා ලෝක ප්‍රජාව විසින් දරන ලද උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ණය කපාහැරීම්, ණය අඩුකිරීම්, දඩ පොලී අයකරන ආකාරය සහ නොගෙවා ඇති ණය ප්‍රති-ලේඛණගත කිරීම් යනාදී නව සංකල්ප බිහිවී ඇත. ජාත්‍යන්තර ප්‍රාග්ධන පැවරුම් සඳහා වූ බැදුම්කර සහ නෝට්ටු වැනි උපකරණයන්ගේ සහ මුදල් වෙළෙඳපොළ උපකරණ සහ මූල්‍ය ව්‍යුත්පන්නයන් යනාදිය වර්ධනය වී ඇති අතර ඒවායේ ජනප්‍රියතාවයත් සැළකියයුතු මට්ටමක පවතී. ගෙවුම් තුලන දත්ත සැකසීමේදී මෙම සියළුම වර්ධනයන් සැළකිල්ලට ගැනීමත් සුදුසු ලෙස ඒවා යොදා ගැනීමත් කළ යුතුව ඇත. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, එහි ගෙවුම් තුලන අත්පොතෙහි සංශෝධිත පස්වන සංස්කරණය (ගෙතුඅ 5) 1993 දී ත් ඒ හා සම්බන්ධිත ගෙවුම් තුලන සැකසීම සඳහා මගපෙන්වීම (Balance of Payments Compilation Guide) සහ මුද්‍රිත පොත (Text Book) පිළිවෙලින් 1995 සහ 1996 වර්ෂවලදී ත් ප්‍රකාශයට පත් කරන ලදී. ගෙතුඅ 5 හි හඳුන්වා දී ඇති ප්‍රධාන වෙනස්කම්වලින් කිහිපයක් සැසඳීම හා සාකච්ඡා කිරීම පහත දැක්වේ.

## ගෙවුම් තුලන අත්පොත් 4 සහ 5 සංස්කරණයන්හි ආකෘති

ගෙවුම් තුලනයට සම්බන්ධ (i) ගනුදෙනු සහ (ii) ගිණුම්වල පවත්නා අනිකුත් වෙනස්කම් (අගය ගැලපීම්, ප්‍රති-වර්ගීකරණය කිරීම් සහ අනිකුත් ගැලපීම්) අතර පැහැදිලි වෙනසක් ගෙතුඅ 5 හි දක්වා ඇත. ගෙවුම් තුලන ගනුදෙනු හෝ අනිකුත් වෙනස්වීම් තොග වෙනස්වීම්වලට හේතුවිය හැකි වුවද, ගෙවුම් තුලන ගිණුම්වල, ගනුදෙනු පමණක් පිළිබිඹු වේ.

මෙයට අමතරව ජාතික ආදායම් ගිණුම් ක්‍රම තුළ ඇති සෙසු ලෝකය සඳහා වූ ගිණුමට ජාත්‍යන්තර ආයෝජන තත්ත්වයෙහි සහ

1. ගෙවුම් තුලන අත්පොත, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, පස්වැනි සංස්කරණය, 1993
2. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එහි සාමාජික රටවල ජාතික ආදායම් ගිණුම් සකස් කිරීම සඳහා මග පෙන්වීමක් වශයෙන් ජාතික ආදායම් ගිණුම් ක්‍රමය (ජාආගික) ප්‍රකාශයට පත් කර තිබේ

## 1 වැනි සංඛ්‍යා සටහන
## ගෙවුම් තුලනය 1996

විශේෂ සටහන (සම්බන්ධවයි)

ගෙතුඅ 4 ආකෘතිය

| ශීර්ෂය | 1996 විගැහි දශලක්ෂ | | |
|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ |
| භාණ්ඩ | 2,822 | 3,731 | (909) |
| 1 වෙළෙඳ භාණ්ඩ | 2,822 | 3,730 | (907) |
| 2 මූල්‍ය නොවන රන් | 0 | 1 | (1) |
| සේවා | 648 | 716 | (68) |
| 3 නැව් කුලී හා වෙළෙඳ භාණ්ඩ රක්ෂණය | 22 | 34 | (12) |
| 4 වෙනත් ප්‍රවාහන වියදම් | 214 | 108 | 107 |
| 4.1 මගී ගාස්තු | 80 | 63 | 17 |
| 4.2 වරාය වියදම් | 120 | 32 | 89 |
| 4.3 වෙනත් | 14 | 13 | 1 |
| 5 සංචාර | 115 | 121 | (7) |
| 6 ආයෝජන ආදායම් | 113 | 252 | (139) |
| 6.1 සෘජු ආයෝජන | 1 | 44 | (43) |
| 6.2 වෙනත් | 112 | 208 | (96) |
| 7 රජයේ වියදම් (වෙන තැනක නොසඳහන්) | 17 | 21 | (5) |
| 8 වෙනත් සේවා | 168 | 179 | (12) |
| 8.1 භාණ්ඩ නොවන රක්ෂණය | 17 | 9 | 8 |
| 8.2 වෙනත් | 151 | 170 | (19) |
| සංක්‍රාම ගෙවීම් | 685 | 87 | 598 |
| 9 පෞද්ගලික | 579 | 87 | 492 |
| 10 නිල | 106 | 0 | 106 |
| ජංගම ගිණුම | 4,156 | 4,534 | (378) |
| ප්‍රාග්ධන හා මූල්‍ය රන් | | | |
| මූල්‍ය නොවන අංශය | 1,084 | 813 | 271 |
| 11 විදේශීය ආයෝජන | 763 | 648 | 115 |
| 11.1 දිගු කාලීන | 216 | 131 | 85 |
| සෘජු ආයෝජන | 69 | 9 | 60 |
| පෞද්ගලීකකරණ ලැබීම් | 23 | 0 | 23 |
| වෙනත් පෞද්ගලික දිගු කාලීන | 124 | 122 | 2 |
| 11.2 කෙටි කාලීන | 547 | 516 | 30 |
| විවිධ ආයෝජන | 53 | 48 | 4 |
| වෙනත් පෞද්ගලික කෙටි කාලීන | 494 | 468 | 26 |
| 12 මහ ආණ්ඩුව | 321 | 165 | 156 |
| 12.1 දිගු කාලීන | 293 | 97 | 196 |
| 12.2 වෙනත් දිගු කාලීන | 29 | 68 | (40) |
| 12.3 කෙටි කාලීන | 0 | 0 | 0 |
| මූල්‍ය අංශය | 599 | 536 | 63 |
| 13 රජය - වත්කම් | 11 | 15 | (4) |
| 14 රජය - වගකීම් | 0 | 0 | 0 |
| 15 වෙළෙඳ බැංකු - වත්කම් | 106 | 116 | (9) |
| 16 වෙළෙඳ බැංකු - වගකීම් | 93 | 33 | 59 |
| 17 මහ බැංකුව - වත්කම් | 234 | 193 | 41 |
| 18 මහ බැංකුව - වගකීම් | 155 | 148 | 7 |
| 19 ජා.මූ.අ. සමග ගණුදෙනු | 0 | 31 | (31) |
| 20 විගැහි වෙන් කිරීම | - | - | - |
| 21 රුපියල් අගය පිළිබඳ ගැලපීම් | - | - | - |
| 22 මූල්‍ය රන් | - | - | - |
| 23 වැරදීම් සහ අත් හැරීම් | 44 | 0 | 44 |

(අ) තාවකාලික

ගෙතුඅ 5 ආකෘතිය

| ශීර්ෂය | 1996 විගැහි දශලක්ෂ | | |
|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ |
| භාණ්ඩ | 2,822 | 3,731 | (909) |
| 1 වෙළෙඳ භාණ්ඩ | 2,822 | 3,730 | (907) |
| මූල්‍ය නොවන රන් | 0 | 1 | (1) |
| 2 සේවා | 535 | 460 | 74 |
| ප්‍රවාහන | 234 | 138 | 94 |
| මගී ගාස්තු | 80 | 63 | 17 |
| නැව් කුලී | 20 | 31 | (13) |
| වෙනත් | 134 | 45 | 67 |
| සංචාර | 115 | 121 | (7) |
| රක්ෂණ සේවා | 19 | 12 | 8 |
| වෙනත් ව්‍යාපාරික සේවා | 151 | 167 | (16) |
| රජයේ වියදම් (වෙන තැනක නොසඳහන්) | 17 | 21 | (5) |
| 3 ආදායම් | 113 | 256 | (142) |
| සේවක වන්දි | 0 | 3 | (3) |
| සෘජු ආයෝජන | 1 | 44 | (43) |
| වෙනත් | 112 | 208 | (95) |
| 4 ජංගම සංක්‍රාම | 617 | 9 | 609 |
| පෞද්ගලික | 579 | 9 | 571 |
| මහ ආණ්ඩුව | 38 | 0 | 38 |
| ජංගම ගිණුම | 4,088 | 4,456 | (368) |
| ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම | 1,351 | 1,040 | 311 |
| ප්‍රාග්ධන ගිණුම | 68 | 78 | (10) |
| ප්‍රාග්ධන සංක්‍රාම | 68 | 78 | (10) |
| මහ ආණ්ඩුව (වෙනත්) | 68 | 0 | 68 |
| වෙනත් අංශ (සංක්‍රමික සංක්‍රාම) | 0 | 78 | (78) |
| මූල්‍ය ගිණුම | 1,283 | 962 | 321 |
| පෞද්ගලික ආයෝජන | 962 | 797 | 165 |
| දිගු කාලීන | 216 | 131 | 85 |
| සෘජු ආයෝජන | 69 | 9 | 60 |
| පෞද්ගලිකරණ ලැබීම් | 23 | 0 | 23 |
| වෙනත් පෞද්ගලික දිගු කාලීන | 124 | 122 | 2 |
| කෙටි කාලීන | 745 | 665 | 80 |
| විවිධ ආයෝජන | 53 | 48 | 5 |
| වෙනත් පෞද්ගලික කෙටි කාලීන | 494 | 468 | 26 |
| වෙළෙඳ බැංකු - වත්කම් | 106 | 116 | (9) |
| වෙළෙඳ බැංකු - වගකීම් | 93 | 33 | 59 |
| මහ ආණ්ඩුව | 321 | 165 | 156 |
| දිගු කාලීන | 293 | 97 | 196 |
| වෙනත් දිගුකාලීන | 29 | 68 | (40) |
| කෙටි කාලීන | 0 | 0 | 0 |
| මූල්‍ය අංශය | 400 | 387 | 13 |
| රජය - වත්කම් | 11 | 15 | (4) |
| රජය - වගකීම් | 0 | 0 | - |
| මහ බැංකුව - වත්කම් | 234 | 193 | 41 |
| මහ බැංකුව - වගකීම් | 155 | 148 | 7 |
| ජා.මූ.අ. සමග ගණුදෙනු | 0 | 31 | (31) |
| විගැහි වෙන්කිරීම් | | | |
| රුපියල් අගය පිළිබඳ ගැලපීම | - | - | - |
| මූල්‍ය රන් | | | - |
| වැරදීම් හා අත් හැරීම් | 44 | 0 | 44 |

(අ) තාවකාලික

**විශේෂ සටහන (සම්බන්ධවයි)**

ගෙවුම් තුලන ගිණුම්වල ඇති සම්බන්ධතාවය හැකි උපරිම මට්ටමින් ශක්තිමත් කිරීමත්, අනුකූල කිරීමත් සිදුකර ඇත. මෙහි දී වැදගත් වන්නේ ක්‍රම දෙකෙහිදීම නේවාසික තත්ත්වය, අගය ගැලපීම, කාලය සම්බන්ධ ගැලපීම් සහ සෘජු ආයෝජන මත ඉපැයුම් නැවත ආයෝජනය යනාදිය සමාන ආකාරයෙන් සැළකීමයි. එමෙන්ම ජාතික ආදායම් ගිණුම් ක්‍රමය සමග අනුකූලතාවය වර්ධනය කිරීම සඳහා ජංගම සහ ප්‍රාග්ධන සංක්‍රාම අතර වෙනස ගෙතුඅ 5 වල හඳුන්වා දී ඇත. මෙම වෙනසෙහි ප්‍රතිඵලයක් ලෙස ගෙවුම් තුලනයෙහි කලින් පැවති ප්‍රාග්ධන ගිණුම, ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම වශයෙන් නැවත හඳුන්වා දී තිබේ. ජාත්‍යන්තර සේවා, ආදායම් සහ සමහර මූල්‍ය ගනුදෙනු සම්බන්ධව සළකන ආකාරය පිළිබඳව ද වෙනස්කම් පවතී.

මෙම වෙනස්කම් සහ රටේ අවශ්‍යතාවයන් සැළකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාව 1997 ආරම්භයේ සිට 1 වන සංඛ්‍යා සටහනෙහි දැක්වෙන නව ආකෘතිය අනුව ගෙවුම් තුලන දත්ත ඉදිරිපත් කරනු ඇත. සේවා ගිණුම සේවා සහ ආදායම් වශයෙන් අංශ දෙකකට බෙදා ඇත. ගෙවුම් තුලන අත්පොතෙහි 4 වන සංස්කරණයට (ගෙතුඅ 4) ප්‍රතිවිරුද්ධව 5 වන සංස්කරණයේ දී (ගෙතුඅ 5) ජංගම ගිණුමෙහි සේවා සම්බන්ධ ජාත්‍යන්තර ගනුදෙනු සහ ආදායම් සම්බන්ධ ගනුදෙනු යනුවෙන් පැහැදිලි වෙන් කිරීමක් සිදු කර ඇත. ගෙතුඅ 4 වන ආකෘතියට අනුව සකස් කරන ලද ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන සංඛ්‍යාවල ශ්‍රමික ආදායම් (වැටුප්) අනිකුත් සේවාවලට ඇතුළත් කර ඇති අතර, ආයෝජන ආදායම් වෙනම සළකන ලදී. පස්වන සංස්කරණයෙහි ආදායම් ගැලීම්වල මූලික අංශ දෙකක් වන සේවක වන්දි සහ ආයෝජන ආදායම්, ජංගම ගිණුමෙහි **ආදායම්** යනුවෙන් වූ උප ගිණුමක් යටතේ වෙනම හඳුන්වා දී ඇත. එබැවින් සේවක වැටුප් සහ උපදේශාත්මක ගාස්තු ශ්‍රමික ආදායම් ලෙස සළකා සේවක වන්දි යටතේ පෙන්වනු ඇත. ගෙතුඅ 4 වල රජයේ සේවා යටතේ දැක්වූ විදේශීය තානාපති කාර්යාලවල සහ ජාත්‍යන්තර සංවිධානවල නේවාසික කාර්ය මණ්ඩල සඳහා වූ ගෙවීම් මෙහි ඇතුලත් වේ. මේ අතර සේවක වියදම් සංචාරක සේවා යටතේ දක්වනු ඇත. දේපළ ආදායම් යටතේ දැක්වෙන ස්වාධිකාර සහ ලිපි හිමිකම් වැනි මූල්‍ය නොවන අස්පෘශ්‍ය වත්කම් භාවිතය සඳහා වූ ගෙවීම් ගෙතුඅ 5 ආකෘතියට අනුව අනිකුත් සේවා යටතේ සටහන් කරනු ඇත. මෙම ප්‍රතිවර්ගීකරණයන් ජාතික ගිණුම් ක්‍රමය තුළ ආදායම් සංකල්පය සමග අනුකූලතාවයක් දක්වන අතර, ගෙවුම් තුලනයෙහි ආදායම් ගිණුම සහ මූල්‍ය ගිණුම අතරත් ගෙවුම් ශේෂයෙහි ගැලීම් සහ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය ඇතුළත් වත්කම් සහ වගකීම්වල තොග අතරත් සම්බන්ධතාවය ශක්තිමත් කරනු ලබයි.

මේ දක්වාම පෞද්ගලික සංක්‍රාම, සේවකයින්ගේ ප්‍රේෂණ මෙන්ම සංක්‍රමිකයනගේ සංක්‍රාම වලින් සමන්විත විය. මෙහි දෙවනුව සඳහන් කළ සංක්‍රාම වලට නිවාස සහ දේපළ අලෙවියෙන් ලද ලැබීම් වැනි ඔවුන් අළුතින් පදිංචිය සඳහා යන රටවලට කරනු ලබන ප්‍රාග්ධන සංක්‍රාම ඇතුලත් වේ. මේ නිසා වර්තමානයේ සිදුවන පරිදි එවැනි සියළු සංක්‍රාම ජංගම ගිණුමෙහි දැක්වීමේ පුරුද්දෙන් ඉවත් වී ගෙතුඅ 5 ආකෘතියට අනුව විදේශයන්හි පදිංචියට යන අයගේ සංක්‍රාම ප්‍රාග්ධන ගිණුමෙහි සංක්‍රාම යටතේ පෙන්වනු ඇත. ජංගම ගිණුමෙහි මෙම සමහර අයිතමයන්ගේ වෙනස්කම් සහ ප්‍රති වර්ගීකරණයන් නිසා ලංකාවේ ජංගම ගිණුමෙහි හිගය, ප්‍රාග්ධන ගිණුමට මාරු කරනු ලැබූ ශුද්ධ සංක්‍රාම ගලායාම්වල ප්‍රමාණයට සමාන ප්‍රමාණයකින් අඩුවනු ඇත.

වර්තමාන මූල්‍ය නොවන ප්‍රාග්ධන ගනුදෙනු නව ආකෘතිය යටතේ **ප්‍රාග්ධන** සහ **මූල්‍ය ගිණුම** වශයෙන් නැවත නම් කරනු ඇත. නව ප්‍රාග්ධන ගිණුම, ආර්ථිකයෙහි නිෂ්පාදනය නොකරන ලද මූල්‍ය නොවන වත්කම් (ස්වාධිකාර, ලිපි හිමිකම් සහ බලපත්‍ර වැනි) අත්පත් කර ගැනීම් / ඉවත් කිරීම සහ ප්‍රාග්ධන සංක්‍රාම වලින් ද සමන්විත වනු ඇත. ඒ අනුව, මධ්‍යම ආණ්ඩුවේ ණය කපාහැරීම (ලංකාවට අදාල නොවේ), රජය විසින් ව්‍යාපෘති සඳහා ලබාගත් සංක්‍රාම සහ ඉහත සඳහන් කළ සංක්‍රමණිකයන්ගේ ප්‍රේෂණ වැනි අයිතමයන් එයට ඇතුලත් වේ. වර්තමාන ප්‍රාග්ධන ගිණුමෙහි අයිතමයන් මූල්‍ය ගිණුමෙහි ඇතුළත් වනු ඇත.

නව ආකෘතිය යටතේ මූලික වෙනසක් වනුයේ වාණිජ බැංකුවල විදේශ වත්කම් සහ වගකීම් **මුදල් අංශයේ** සිට **මූල්‍ය ගිණුමට** විතැන් කිරීමයි. වර්තමානයේ, ගෙවුම් තුලනයෙහි සමස්ථ ශේෂය, වාණිජ බැංකුවල විදේශ වත්කම් ද ඇතුලත් වූ ශුද්ධ විදේශීය වත්කම්වල මුළු වෙනස නියෝජනය කරයි. වාණිජ බැංකුවල වත්කම් සහ වගකීම්වල වෙනස ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුමට විතැන් කිරීම සාධාරණීකරණය කරන මූලික සාධක දෙකකි. පළමුව, පාලනයන්ට යටත්ව තිබූ අවදියේ දී මෙන් නොව වර්තමානයේ දී වාණිජ බැංකු ඔවුන්ගේ විදේශ විනිමය ගනුදෙනු මෙන්ම විදේශ විනිමය සම්පත් පාලනය කිරීම සම්බන්ධ නිදහස භුක්ති විඳී. මෙයට අමතරව ඔවුන්ගේ ප්‍රාග්ධන අරමුදල් සහ සංචිතවලින් සියයට 15 ක සීමාවකට යටත්ව විදේශීය ණය ගැනීම සඳහා ද අවසර දී තිබේ. මේ නිසා සමස්ථ ශේෂය ලබා ගැනීමේ දී එම අයිතමයන් මූල්‍ය බලධාරීන්ගේ ගිණුම්වලට සම්බන්ධ කරනවා වෙනුවට අළුතින් නිර්වචනය කර ඇති මූල්‍ය ගිණුමෙහි ඇතුලත් කිරීම වඩා යෝග්‍ය බව පෙනේ. දෙවනුව, විශ්ලේෂණාත්මකව බලන කළ මෙය සමස්ථ ශේෂයෙහි වඩාත් අර්ථවත් භාවයක් පෙන්වනු ඇත. ශුද්ධ විදේශීය වත්කම්වල වෙනස හා බැඳී පවත්නා සංචිත මුදල්වල වෙනස (අධිබලැති මුදල්) සමස්ථ ශේෂයට සත්‍ය වශයෙන්ම සමාන වන නිසා අළුතින් නිර්වචනය කර ඇති සමස්ථ ශේෂය විදේශීය ගනුදෙනු මුදල් සැපයුමට ඇති කරන බලපෑම සෘජුවම පෙන්නුම් කරනු ලබයි.

මූල්‍ය ගිණුමෙහි වාණිජ බැංකු ගනුදෙනුවල ශුද්ධ තත්ත්වය පෙන්නුම් කිරීමෙහි ප්‍රතිඵලයක් වන්නේ, වාණිජ බැංකු ගනුදෙනුවල ශුද්ධ ප්‍රතිඵලය අතිරික්තයක් ද නැතහොත් හිගයක් ද යන්න මත රදා පැවතෙමින් ගෙවුම් ශේෂයෙහි සමස්ථ ශේෂය පිරිහීම හෝ වර්ධනය වීම සිදුවීමයි. නිදසුනක් වශයෙන්, වාණිජ බැංකු, මුදල් අංශය යටතේ ගෙතුඅ 4 ආකෘතියට අනුව වාර්තා කල විට 1996 ගෙවුම් තුලනයෙහි සමස්ථ ශේෂය විගැහි දශලක්ෂ 63 ක හිගයක් පෙන්වන අතර, වාණිජ බැංකු මූල්‍ය ගිණුම යටතේ ( ගෙතුඅ 5 ආකෘතිය) ඇතුළත් කල විට ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය විගැහි දශලක්ෂ13 ක හිගයක් වේ.

විශේෂ සටහන් 9 (විදේශ මුදල් බැංකු ඒකකයන් මූල්‍ය සමීක්ෂණයෙහි ඇතුළත් කිරීම) යටතේ සඳහන් කර ඇති වෙනස්කම් ඇතුළත් කරමින් නව ගෙතුඅ 5 ආකෘතිය 1997 ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන දත්ත සමග හඳුන්වාදීමට බලාපොරොත්තු වනු ලැබේ.

ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ ලබා ගත් ණය ආපසු ගෙවීම තවදුරටත් සිදු වීම නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ණය වලින් නොගෙවා ඉතිරිව තිබූ ණය විගැහි දශලක්ෂ 31 කින් අඩු වී වර්ෂය අවසානය වන විට විගැහි දශලක්ෂ 369 ක් විය. නොගෙවා ඉතිරිව ඇති කෙටිකාලීන ණය ප්‍රාග්ධන විගැහි දශලක්ෂ 725 සිට විගැහි දශලක්ෂ 751 දක්වා වැඩි වූ අතර මෙයට මූලික වශයෙන් හේතු වූයේ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලබා ගත් ප්‍රතිග්‍රහණ ණය වල වැඩි වීමයි.

## 9.10 ණය සේවා ගෙවීම්

මැදි හා දිගුකාලීන ණය ආපසු ගෙවීම් හා සියළුම විදේශ ණය වෙනුවෙන් කරන ලද පොලී ගෙවීම් අඩංගු ණය සේවා ගෙවීම්, 1996 වර්ෂයේදී විගැහි දශලක්ෂ 526 දක්වා සියයට 18 කින් වැඩිවිය. ණය ආපසු ගෙවීම් සහ පොලී ගෙවීම් පිළිවෙලින් විගැහි දශලක්ෂ 57 කින් සහ විගැහි දශලක්ෂ 26 කින් වැඩි විය. ජා.මු. අ. ණය ආපසු ගෙවීම් වැඩි වීමට හේතු වූයේ ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ 1988 සහ 1990 කාලය තුලදී ලබාගත් ණය ආපසු ගෙවීමයි. රජයේ ණය ආපසු ගෙවීම් විගැහි දශලක්ෂ 22 කින් වැඩිවිය. පොලී ගෙවීම් 1995 විගැහි දශලක්ෂ 182 සිට 1996 විගැහි දශලක්ෂ 208 දක්වා වැඩිවීම ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයද ඇතුලත්වූ රජය සහ රජය සහතික කරන ලද ණය වෙනුවෙන් වූ පොලී ගෙවීම නිසා සිදුවිය. ණය සේවා ගෙවීම්වල වර්ධනය, භාණ්ඩ හා සේවා අපනයනයේ වර්ධනය ඉක්මවා යාම නිසා ණය සේවා අනුපාතය 1995 වූ සියයට 13.9 සියයට 1996 15.2 දක්වා වැඩිවුන අතර ණය සේවා ගෙවීම් භාණ්ඩ, සේවා සහ පෞද්ගලික සංක්‍රාමවල අනුපාතිකයන් වශයෙන් ගත් කළ එය වර්ෂ දෙක තුලදී සියයට 11.9 සිට සියයට 13.0 දක්වා වැඩිවිය.

## 9.11 විදේශීය වෙළෙඳ වාතාවරණය සහ ප්‍රතිපත්තිය

### ආනයන සහ අපනයන පාලන

ප්‍රමාණාත්මක සීමාවන් ප්‍රධාන වශයෙන් ජාතික ආරක්ෂාව, පොදු සෞඛ්‍යය සහ හරිත සංරක්ෂණය සඳහා අත්‍යවශ්‍ය යැයි සැලකෙන හොඳින් නිර්වචනය කළ පටු ලැයිස්තුවකට සීමා කරමින්, වෙළෙඳ ප්‍රතිපත්තිය ක්‍රමයෙන් ප්‍රමාණාත්මක සීමාවන් අවම කිරීම සඳහා වැඩි නැඹුරුවක් දැක්විය. සමහර කර්මාන්ත සඳහා අවම වෙළෙඳ ආරක්ෂණයක් අවශ්‍ය අවස්ථාවලදී එවැන්නක් ලබාදිය යුත්තේ අවම තීරු බදු වැනි මිල පාදක කොටගත් ක්‍රම මගිනි. ශ්‍රී ලංකාව ඉහළ ආරක්ෂණයක් සහිත වෙළෙඳ ප්‍රතිපත්තියක සිට අඩු ආරක්ෂණයක් සහිත ව්‍යුහයක් කරා ගමන් කරමින් සිටී.

එසේ වුවද, 1996 වසර තුළදී සමහර පරස්පර විරෝධී සංඥා පෙන්නුම් කරන ලදී. උදාහරණයක් ලෙස අර්තාපල්, ළූණු සහ මිරිස් සඳහා ආනයන බලපත්‍ර අවශ්‍යතාවය ඉවත් කරමින් වෙළෙඳ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ප්‍රගතියක් 1996 ජූලි මාසයේ දී තවදුරටත් පෙන්නුම් කරන ලද අතර, හරිත සංරක්ෂණය අරමුණු කොට වී ආනයනය බලපත්‍ර යටතට ගෙන එන ලද අතර 1996 වසර තුලදී ඉරිඟු ආනයන, බලපත්‍ර යටතේ පවත්වාගෙන යන ලදී. පොදු ආරක්ෂාව සඳහා අවශ්‍යතාවයක් ලෙස සලකා දුරස්ථපාලක මගින් ක්‍රියාකරන සෙල්ලම් බඩු සහ පරිසර ආරක්ෂාව සඳහා අවශ්‍යතාවයක් ලෙස, සලකා භාවිතා කළ සහ අළුත්වැඩියා කර සකස්කර ගන්නා ලද ශීතකරණ සහ වායු සමනය කරන යන්ත්‍ර ආනයන බලපත්‍ර යටතට පවරා ගන්නා ලදී. පරිසරය සුරැකීම සඳහා ප්‍රමාණාත්මක සීමාවන් පැනවීමේ (බලපත්‍ර යටතට ගැනීම ඇතුළුව) යෝග්‍යතාවය විවාදයට තුඩුදෙන කාරණයකි. බලපත්‍ර නිකුත් කිරීම නිසා ඒවා නිකුත් කරන බලධාරීන්ට සිය අභිමතය පාවිච්චි කිරීමට බලයක් ඇතිවීම නිසා පරිපාලන අක්‍රමිකතා ඇතිවේ. රජය සහ පෞද්ගලික අංශයේ පිටි ඇඹරුම් කර්මාන්ත ශාලාවක් වන සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම අතර පැවති ගිවිසුමෙහි කොන්දේසි සපුරාලනු පිණිස 1996 වසර තුළදීද තිරිඟු, මෙස්ලින්, තිරිඟු පිටි සහ මෙස්ලින් පිටි ආනයන සඳහා බලපත්‍ර අවශ්‍යතා පවත්වාගෙන යනු ලැබීය. පෞද්ගලික අංශයට ආනයන වෙළෙඳාමට නිදහස්ව ඇතුළුවීමට සහ තිරිඟු ඇට පිටිකිරීම සඳහා රජයේ සම්බන්ධයකින් තොරව ඇඹරුම් කර්මාන්තශාලාවට කෙලින්ම භාරදීමට හැකිවන පරිදි, පිටි ඇඹරුම් සමාගම සමග ඇති ගිවිසුම් නැවත සාකච්ඡා කිරීම යෝග්‍ය වනු ඇත. 1996 වසර අග වන විට රේගු දත්ත ලේඛණ අංකිත ක්‍රමයේ (Harmonised Systerm Code) අංක හයක මට්ටමක ඇති 6000 ක් පමණ වන මුළු භාණ්ඩ සංඛ්‍යාවෙන් භාණ්ඩ 223 ක් බලපත්‍ර යටතේ පවත්වාගෙන යන ලදී.

පසුගිය වසර වලදී මෙන්ම මෙම වසර තුළදීද පරිසර ආරක්ෂාව සහ පෞරාණික වස්තු සංරක්ෂණය උදෙසා අපනයන වර්ග හතරක් (කොරල්, සිප්පි සහ කටු, කළුවර දැව නිෂ්පාදන, ඇත්දළ සහ ඇත්දත් නිෂ්පාදන සහ 1945 ට ප්‍රථම ලියාපදිංචි කරන ලද මගී ප්‍රවාහන මෝටර් රථ) අපනයන බලපත්‍ර යටතේ පැවතිණි.

### විදේශීය වෙළෙඳාම මත වූ තීරු බදු සහ අනිකුත් බදු

පසුගිය කාලයේ දී සිදුකළ තීරුබදු සංශෝධන වල අරමුණ වූයේ අවිධිමත් ලෙස ප්‍රදානය කරන ලද බදු නිදහස් කිරීම් සහ බදු සහන නිසා හටගත් ව්‍යාකූලතා අවම කිරීම සඳහා තීරුබදු ව්‍යුහය සරල කිරීම සහ තීරුබදු අඩුකිරීම් තුළින් වෙළෙඳ සහ තීරුබදු ව්‍යුහය විධිමත් කිරීමයි. 1996 නොවැම්බර් මස දී ඉදිරිපත් කරන ලද 1997 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයෙන් වෙළෙඳ හා තීරුබදු ප්‍රතිපත්තියෙහි අවධානය යොමු කරන ලද්දේ රේගු පරිපාලනය, වෙළෙඳ ක්‍රියා පිළිවෙලවල් සහ අනුගමනය කළ ක්‍රියාමාර්ග සහ අනෙකුත් ආයතනික ක්‍රියාපටිපාටියන් වැඩිදියුණු කිරීම් තුලින් තීරු බදු ව්‍යුහය යථා පරිදි ක්‍රියාත්මක වීම සහතික කිරීම සහ විවිධ බදු ක්‍රම සහ දිරිගැන්වීමේ යෝජනාක්‍රම නිසා හටගත් ව්‍යාකූලතා තවදුරටත් ඉවත් කර ගැනීමයි. 1995 පෙබරවාරියේදී ක්‍රියාත්මක කරන ලද සියයට 10, 20, සහ 35 වශයෙන් වූ තීරු බදු අනුප්‍රමාණ අනු කාණ්ඩ තුනකින් යුත් තීරුබදු ව්‍යුහය 1996 වසර තුළදී ද නොවෙනස්ව පැවතිණි. එසේ වුවද අනු කාණ්ඩ කිහිපයකට අයත් ආනයන, නම් වශයෙන් ගත් කළ දුම්කොළ, මත්පැන්, බොරතෙල් සහ සමහර කාණ්ඩ වලට අයත් මෝටර් රථ, කාණ්ඩ තුනකින් යුත් තීරු බදු ව්‍යුහයට බාහිරව තව දුරටත් පවත්වා ගන්නා ලදී.

අනු කාණ්ඩ දෙකකින් යුතු බදු ව්‍යුහයක් වෙත යොමු වීම මධ්‍යකාලීන අරමුණක් ලෙස පැවතිණි. රේගු අධීක්ෂණය, පරිපාලනය ඇතුළුව රේගු ක්‍රියාමාර්ග, වෙළෙඳාම පහසුකිරීමේ යෝජනා සහ ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම් පිළිබඳව හදාරා අවශ්‍ය වෙනස්කම් නිර්දේශ කිරීම සඳහා 1997 අයවැය ලේඛනය මගින් වෙළෙඳ සහ තීරුබදු කොමිසමක් පිහිටුවීමට (Trade and Tariff Commission) යෝජනා කරන ලදී.

බදු සහන සහ බදු අත්හැරීම් අනිසි ලෙස පාවිච්චි කිරීම අවම කිරීම සඳහා විවිධ පියවර කීපයක් 1997 අයවැයෙන් යෝජනා කරන ලදී. පහසුකම් අනිසි ලෙස පාවිච්චි කරන්නන් සහ බදු ගෙවීම පැහැරහරින්නන් සඳහා මාස තුනකින් කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් වල පොලී අනුපාතයට සමාන

බද්දක් පනවන ලදී. දේශීය කර්මාන්ත වලට අවම ආරක්ෂණයක් තහවුරු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීමට රේගු ආඥාපනතේ 19 වගන්තිය යටතේ තීරුබදු අත්හැරීම් ප්‍රදානය කරනු ලබන විවිධ භාණ්ඩ සඳහා සියයට 5 ක අවම බද්දක් පැනවීමට යෝජනා කරන ලදී. පසුගිය වසරේදී මෙන්ම ක්ෂණික බදු අත්හැරීම් පහසුකම් සැලසීම ජාතික වැදගත්කමක් ඇති අත්‍යවශ්‍ය භාණ්ඩ වලට පමණක් සීමාකරන ලදී.

සමහර පරස්පර විරෝධිතා නිවැරදි කිරීම සහ සමහර අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල රේගු බදු ඉවත්කිරීමේ අදහසින් තීන්ත සහ පොලියෙස්ටර් යොදන ලද වාර්නිෂ් වර්ග, ඇක්‍රලික් හෝ වයිනයිල් පොලිමර්, අත්ලේන්සු, මුහුණ පිස දමන හෝ පිරිසිදු කිරීමට භාවිතා කරන කඩදාසි සහ තුවා, රේඩියේටර, සයිලන්සර සහ වායු පිටකිරීමට යොදන නල වල බදු සියයට 35 සිට සියයට 20 දක්වා අඩු කරන ලද අතර, පිටිකිරි ඇසිරීමට යොදාගන්නා ඇළුමිනියම් පටල, සමහර වර්ගවල ඩීසල් එන්ජින්, මෝටර් වාහන ෆිල්ටර, එලිමන්ට්ස් (automotive filters) ක්ලච් (clutches) සහ අමතර කොටස් සඳහා බදු සියයට 35 සිට සියයට 10 දක්වා අඩු කරන ලදී. බදු නිදහස් කිරීම් ලබාදුන් ආනයන වූයේ පෙරදී සියයට 10 මට්ටමක පැවති මුහුදේ ගමන් කළ හැකි එන්ජින්, සිලින්ඩර් 4 ක් සහිත සහ ඝන සෙමී. 3250ට වැඩි එන්ජින් සහ බස්රථ වලට සවිනොකරන ලද වැසි යනාදියටයි.

**සංඛ්‍යා සටහන 9.11**

**සඵල ආනයන බදු එකතු කිරීමේ අනුපාතය (අ)**

| වර්ගය | 1994 | 1995 | 1996 |
|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | 20.1 | 12.9 | 12.4 |
| ආහාරපාන වර්ග | 22.7 | 13.9 | 12.2 |
| සහල් | 35.2 | 38.5 | 0.3 |
| පිටි | — | 0.1 | 2.3 |
| සීනි | 19.7 | 14.6 | 15.9 |
| කිරි හා කිරි නිෂ්පාදන | 14.5 | 11.5 | 11.5 |
| කරවල | 5.2 | 2.0 | 2.1 |
| වෙනත් මාළු නිෂ්පාදන | 5.5 | 4.6 | 4.2 |
| වෙනත් ආහාර 37.4 | 18.7 | 19.0 | |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 17.3 | 11.6 | 12.6 |
| මෝටර් රථ හා සයිකල් | 24.1 | 21.7 | 24.3 |
| ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර | 6.1 | 6.9 | 12.1 |
| රබර් ටයර් හා ටියුබ් | 41.4 | 33.6 | 32.5 |
| බෙහෙත් සහ ඖෂධ | 1.4 | 1.5 | 1.5 |
| ආහාර නොවන වෙනත් ද්‍රව්‍ය | 18.2 | 11.1 | 10.6 |
| **අන්තර් භාණ්ඩ** | 8.0 | 9.1 | 8.2 |
| පොහොර | 0.1 | - | - |
| බොර තෙල් | 43.0 | 44.5 | 39.8 |
| වෙනත් ඛනිජ තෙල් | 18.7 | 23.4 | 24.7 |
| රසායනික ද්‍රව්‍ය හා සංයෝග | 8.3 | 9.8 | 7.6 |
| ඩයි වර්ග පදම් කිරීමේ හා වර්ණ ද්‍රව්‍ය | 9.6 | 8.8 | 8.2 |
| කඩදාසි හා ඝන කඩදාසි | 10.1 | 9.8 | 6.9 |
| රෙදිපිළි හා ඇඟළුම් | 0.9 | 1.0 | 1.1 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 8.5 | 9.2 | 5.7 |
| **ආයෝජන භාණ්ඩ** | 9.6 | 10.1 | 7.6 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 10.8 | 8.7 | 9.3 |
| ගමනාගමන උපකරණ | 14.6 | 21.6 | 18.9 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 6.0 | 6.2 | 3.9 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 15.0 | 10.1 | 6.7 |
| එකතුව | 10.9 | 10.1 | 8.8 |

(අ) මුළු තීරුබදු එකතුව, මුළු ආනයන වටිනාකමෙහි (මි.රු.ගැ.) ප්‍රතිශතයක් ලෙස

මූලය: ශ්‍රී ලංකා රේගුව

තනි මධ්‍යස්ථ අනුපාතයක් සහිත භාණ්ඩ සහ සේවා බදු ක්‍රමයකට පහසුවෙන් පරිවර්තනය වීම සඳහා වර්තමාන පිරිවැටුම් බදු ලැයිස්තුවෙහි, පෙර සියයට 6 සහ සියයට 10 මට්ටම් වල පැවතුනු බදු කාණ්ඩ 1996 නොවැම්බර් 6 වන දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි පිළිවෙලින් සියයට 7 සහ සියයට 11 දක්වා ඉහළ නැංවෙනසේ සංශෝධනය කරන ලදී. මේ අතර පිරිවැටුම් බදු සියයට 6 කාණ්ඩයට අයත්ව පැවති සීනි, ගුම්තෙල් සහ ඩීසල්, සියයට 20 කාණ්ඩයට අයත්ව පැවති තේ ඇසිරීමේදී ඇතුලත ඇසුරුමට භාවිතා කරන ක්‍රාෆ්ට් බෝඩ් සහ ක්‍රාෆ්ට් කඩදාසි මළු සහ කපාපු පොල්, සියයට 10 කාණ්ඩය යටතේ පැවති තේ තොග වශයෙන් ඇසිරීම සඳහා භාවිතා කරන ඇළුමිනියම් පටල යනාදිය පිරිවැටුම් බදු වලින් නිදහස් කිරීමෙන් අවිධිමත් ලෙස පැවති බදු ලැයිස්තුව නිවැරදි කිරීමට පියවර ගන්නා ලදී. යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයනය සඳහා වන ජාතික ආරක්ෂක බද්ද 1995 දී පැවති සියයට 2 සිට තව දුරටත් සියයට 0.5 දක්වා අඩු කරන ලදී.

මෝටර් රථ අමතර කොටස් ආනයන සඳහා අනුබල සැපයෙන, හොඳ තත්ත්වයක නොපවතින පරණ වාහන ආනයනය අධෛර්යමත් කිරීම සඳහා පාවිච්චි කරන ලද මෝටර් රථ ආනයන බදු සහ අනෙක් බදු ගණනය කිරීමේදී භාවිතා කරන ක්ෂයවීමේ අනුපාතය ප්‍රතිශතක අංක 5 කින් අඩුකිරීමට අයවැයෙන් යෝජනා කරන ලදී. වර්ෂ 7 කට වැඩියෙන් භාවිතා කළ වාහන සඳහා උපරිම ක්ෂයවීමේ නැවිය. වටිනාකම සියයට 30 ක ස්ථාවර අගයකට යටත්වේ. වර්තමාන ලේඛනය යටතේ වසර 9 ක් පාවිච්චි කළ වාහන සඳහා උපරිම ක්ෂයවීම සියයට 10 දක්වා ක්‍රමයෙන් අඩු කරනු ලැබේ.

ආහාර ද්‍රව්‍ය වල මිල ඉහළ යාමේ ප්‍රශ්නය මගහැරවීම සඳහා සහනයක් වශයෙන්, 1996 අප්‍රේල් 15 වන දින සිට මාස 8 1/2 ක කාලපරිච්ඡේදයකට සහල් ආනයන සඳහා පූර්ණ බදු අත්හැරීමක් (සියයට 35 ක) සිදු කරන ලදී. 1996 ජුනි 1 දා සිට මාස 7 ක කාලපරිච්ඡේදයක් සඳහා පූර්ණ බදු අත්හැරීමක් (සියයට 10 ක) ලබාදීමෙන් විදුලිබල උත්පාදන යන්ත්‍ර ආනයනය දිරිගන්වන ලදී. පොල් මද නිෂ්පාදන වල අන්තර්ජාතික මිල ඉහළ යාමේ තත්ත්වය යටතේ දේශීය කර්මාන්ත වලට අත දීමක් වශයෙන් සහ ආහාරයට ගන්නා තෙල් වර්ග වල මිල අඩුකිරීම සඳහා කොප්පරා සහ ආහාරයට ගන්නා තෙල් වර්ග (පොල් තෙල් හැර) සඳහා සියයට 30 ක බදු අත්හැරීමක් 1996 ජුනි 12 සිට මාස 7 1/2 ක කාලපරිච්ඡේදයක් සඳහා ලබා දෙන ලදී. රෙදිපිළි නිෂ්පාදනයන්ට, මෙන්ම ඉස්සන් සහ කෑම පිණිස කුකුලන් ඇති කරන දේශීය නිෂ්පාදකයන්ට සහන සැලසීමේ පියවරක් වශයෙන් පිළිවෙලින් නූල්, ඉස්සන්ගේ සහ කුකුලන්ගේ කෑම සඳහා වූ බදු අත්හැරීමක් සිදු කරන ලදී.

බද්දට යටත්වන ආනයන, විශේෂයෙන්ම ආයෝජන භාණ්ඩ වල අඩුවීමක් පෙන්නුම් කරමින් සඵල ආනයන බදු අනුපාතය, එනම් ආනයන බදු එකතුව සහ මුළු ආනයන අතර අනුපාතය, 1995 වසරේ අගය වන සියයට 10.1 සිට, සියයට 8.8 දක්වා, 1996 වසර තුළ දී පහත වැටුණි. ආයෝජන භාණ්ඩ කාණ්ඩයෙහි සඵල බදු අනුපාතයේ කැපීපෙනෙන අඩුවීමක් පෙන්නුම් කරන ලද්දේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්ත සඳහා භාවිතා කරන යන්ත්‍රෝපකරණ ආනයන, 1995 නොවැම්බර් සිට ආනයන බද්දෙන් නිදහස් කිරීම නිසාත්, 1996 වසර තුළදී කැපීපෙනෙන ලෙස ආනයන වියදමෙහි වැඩිවීමක් පෙන්නුම් කළ විදුලිබල උත්පාදන යන්ත්‍ර ආනයන සඳහා 1996 ජුනි මස සිට බදු අත්හැරීමක් සිදුකිරීමත් නිසාය. ප්‍රවාහන උපකරණ වෙනුවෙන් බදු එකතු කිරීමේ අඩුවීමක් පෙන්නුම් කරන ලද්දේ ප්‍රවාහන උපකරණ ආනයන

සඳහා ඉහළ නැංවුනු ආනයන වියදම වැඩි වශයෙන්ම දරනු ලැබුයේ රජයට අයත් දුම්රිය දෙපාර්තමේන්තුවේ බද්දට යටත් නොවන ආනයන සඳහා වූ බැවිනි.

පාරිභෝගික භාණ්ඩ කාණ්ඩය යටතේ ආහාර පාන ආනයනයන් සඳහා සඵල ආනයන බදු අනුපාතයේ අඩුවීමක් පෙන්නුම් කරන ලද අතර, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා එම අනුපාතයේ වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. ආහාර පාන කාණ්ඩයට අයත් සඵල ආනයන බදු අනුපාතයේ අඩුවීමක් දක්නට ලැබුනේ ප්‍රධාන වශයෙන්ම සහල් ආනයන සඳහා වසරේ මාස 8 1/2 ක කාලපරිච්ඡේදයක් තුළ සියයට 35 ක සම්පූර්ණ බදු අත්හැරීමක් සිදු වූ බැවිනි. ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයේ මෝටර් රථ සහ බයිසිකල් සඳහා සඵල ආනයන බදු අනුපාතයේ වැඩිවීමට හේතුවූයේ රජයේ නිලධාරීන් වෙනුවෙන් තීරුබදු රහිත වාහන ආනයන සඳහා වූ සහනය අත්හිටුවීමයි.

අන්තර්භාණ්ඩ කාණ්ඩයේ සඵල බදු අනුපාතයේ අඩුවීමට හේතුවූයේ 1996 අයවැයෙන් මුද්‍රණය, මසුන් ඇල්ලීම, දැව නිෂ්පාදන, සේයාපටල, මැණික් සහ ආභරණ කර්මාන්ත වලට අවශ්‍ය අමුද්‍රව්‍ය සඳහා බදු අඩුකිරීමය.

1996 වසර තුලදී ද අපනයන අංශය, වටිනාකම මත පනවන බදු සහ අනෙකත් බදු වලින් නිදහස්ව පැවතුනු අතර සමහර අපනයන සඳහා පමණක් සෙස් බද්ද සහ රාජ්‍ය භාර අයකිරීම තවදුරටත් ක්‍රියාත්මකව පැවතුණි.

## රෙදිපිළි සහ ඇඟළුම් පංගු ප්‍රමාණයන් වෙන් කිරීම

1995 වසරේදී හඳුන්වාදුන් අතීත අපනයන ක්‍රියාකාරිත්වය මත පදනම් කර ගත් පංගු වෙන් කිරීමේ ක්‍රමය 1996 වසර තුළදී ද ක්‍රියාත්මක වූ අතර රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදකයන් මෙම ක්‍රමය කෙරෙහි සාමාන්‍යයෙන් ප්‍රසාදයක් දැක්විය. 1996 වසර තුළදී පංගු වෙන් කිරීමේ ප්‍රධාන සංශෝධනයක් සිදු නොවිය. යම්කිසි කණ්ඩායමකට පොදුවේ පංගු (Pool Quota) වෙන් කිරීමේදී ප්‍රමුඛත්වය දෙන ලද්දේ අළුත් අපනයනකරුවන්ට සහ පවත්නා ධාරිතාව පුළුල් කර ගත් අපනයනකරුවන්ටය.

## අපනයනකරුවන් සඳහා දිරිගැන්වීම්

අපනයන වැඩිදියුණු කිරීම සඳහා 1996 වසර තුළදීද බදු ප්‍රතිදාන ක්‍රම (Duty Rebate Scheme), බන්ධිත ගුදම් පහසුකම් සැපයීමේ ක්‍රමය (Bonded Warehouse Scheme), අපනයන සඳහා භාණ්ඩ නිපදවීමට තීරුබදුවලින් තොරව යෙදවුම් ආනයනය කිරීමේ ක්‍රමය (Inward Processing Scheme) සහ බදුවලින් නිදහස් කිරීම් ආදී නොයෙක් දිරිගැන්වීම් නොකඩවා ලබාදුනි. මෙම දිරිගැන්වීම් ලබා ගැනීමේදී වර්තමානයේ පවතින සංකීර්ණ ක්‍රම නිසා ඇතිවන පරිපාලන ප්‍රමාදයන් ඉවත්කිරීම සඳහා එවැනි වැඩපිළිවෙලවල් 1997 ජනවාරි මස සිට කෙලින්ම රේගු දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට 1997 අයවැයෙන් යෝජනා කරන ලදී.

සුළු සහ මධ්‍යම පරිමාණ අපනයනකරුවන්ට ඔවුන්ගේ ආයෝජනවල ඵලදායිතාව වැඩිකර ගැනීමටත්, ජාත්‍යන්තර වෙළෙඳපොළේ තරගකාරීබව වැඩි දියුණු කර ගැනීමටත් අවස්ථාව සැලසෙන පරිදි ප්‍රාග්ධන භාණ්ඩ සහ අතරමැදි භාණ්ඩ බදුවලින් නිදහස් කිරීමේ ක්‍රමය යටතේ තම නිෂ්පාදනයෙන් සියයට 90 කට වඩා අපනයනය කරනු ලබන අපනයනකරුවන්ට පමණක් මෙතෙක් හිමිවූ සියයට 100 ක තීරුබදු සහ අනෙකුත් බදු නිදහස් කිරීම්, සුළු හා මධ්‍යම පරිමාණයේ අපනයනකරුවන්ටද ලබාදීමට යෝජනා කරන ලදී. මෙම ක්‍රමය යටතේ තම නිෂ්පාදනයෙන් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් අපනයන කරනු ලබන අපනයනකරුවන්, ආනයනය කරනු ලබන, ප්‍රාග්ධන භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ මත අයකරනු ලබන තීරුබදුවලින් සහ අනෙකුත් බදුවලින් සියයට 100 කින් නිදහස් කිරීමටත්, තම නිෂ්පාදිතවලින් සියයට 25 ත් 50 ත් අතර ප්‍රමාණයක් අපනයනය කරනු ලබන අයට සියයට 50 ක බදුසහන ලබාදීමටත් යෝජනා කරන ලදී.

1997 අයවැය යෝජනාවක් අනුව පොලී අනුපාත පහළ දැමීමේ සහ පෞද්ගලික අංශයට වැඩි වැඩියෙන් අරමුදල් ලබා ගැනීමට පහසු කිරීමේ අරමුණින්, තමන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විදේශ විනිමය ප්‍රමාණවත් ලෙස ලබා ගැනීමට හැකියාව තිබෙන අපනයනකරුවන්ට, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක සහ දේශීය බැංකු ඒකකවල අරමුදල් භාවිතා කර විදේශීය මුදල් ණය ලබාදීමට වාණිජ බැංකුවලට හැකිවන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව මගින් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. විනිමය පාලක විසින් අනුමැතිය ලබා දෙන ලද අපනයනකරුවන් සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා සපයන්නන්ද, අපනයනකරුවන්ට අවශ්‍ය උපාංග නිපදවීමට භාවිතා කරන ආනයන වෙනුවෙන් මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා විදේශ මුදල් ණය ලබා ගැනීමට සුදුසුකම් ලබති. වාණිජ බැංකුවලට උපදෙස් මාලාවක් නිකුත් කිරීමත් සමගම 1997 ජනවාරි 3 ද සිට මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ.

ආනයනය කරන රටවල් විසින් අධික ආනයන බදු මගින් ආවරණය කරන ලද නිෂ්පාදන හා තරගකාරීවිය යුතු, සාම්ප්‍රදායික නොවන, කෘෂි නිෂ්පාදන, අපනයනකරුවන්ට සහනයන් ලබාදීමට හා අධික ගුවන්නැව් ගාස්තු බර අඩු කිරීම සඳහා පියවරක් ලෙස විසිතුරු පැළෑටි, මල්, පළතුරු සහ එළවළු ආදිය අපනයනය කිරීමේදී එයාර් ලංකා සමාගමට ගෙවන ලද ලැයිස්තුගත ගුවන් නැව් ගාස්තු සඳහා සියයට 100 ක ප්‍රතිදානයක් ලබා දෙන ලදී.

## අපනයනකරුවන් සඳහා ආයතනික පහසුකම්

අපනයන සංවර්ධන මණ්ඩලය (අ.සං.ම.) මගින් 1996 වසර තුළදීද අපනයන වර්ධනය උදෙසා සේවාවන් රැසක් නොකඩවා ලබා දුනි. අපනයන සඳහා යොමුවූ කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාවසායකයන්ට වෙළෙඳපොළවල් ලබා ගැනීමට, නිෂ්පාදන වැඩි දියුණුවට සහ උපදෙස් සේවා ලබා ගැනීමට හැකිවන පරිදි අපනයන සංවර්ධන මණ්ඩලය මගින් 1996 වර්ෂය තුළදී, දකුණු, මධ්‍යම සහ වයඹ පළාත්වල ප්‍රාදේශීය කාර්යාල පිහිටුවනු ලැබීය. ආයෝජන නිෂ්පාදන ගම්මාන ඇතුළුව විශේෂයෙන්ම සම්ප්‍රදායික නොවන අපනයන සඳහා සුළු පරිමාණ මෙන්ම මහා පරිමාණ ව්‍යාපෘතිවලට මූල්‍යමය පහසුකම් සැපයීමද තවදුරටත් සිදු කරන ලදී. වෙළෙඳපොළ වර්ධනයට අතදීමක් වශයෙන් ස්වර්ණාභරණ, ඇඟළුම්, සම් සහ රබර් නිෂ්පාදිත, ස්වභාවික මල්, අත්කම් භාණ්ඩ ඇතුළු විශාල පරාසයකට අයත් නිෂ්පාදන ගණනාවක් සඳහා විශේෂවූ වෙළෙඳපොළවල් විශාල ප්‍රමාණයකට හා සාමාන්‍ය වෙළෙඳපොළවල් වලට සහභාගිවීමට කටයුතු සංවිධානය කිරීම මෙන්ම ව්‍යාපාර කටයුතු සඳහා හමුවීම් සහ අලෙවිය වැඩි දියුණු කිරීමේ වැඩපිළිවෙලවල්ද අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සංවිධානය කරන ලදී. තාක්ෂණික සහයෝගය, නිෂ්පාදිත වැඩි දියුණු කිරීම සහ වෙළෙඳපොළ අවශ්‍යතා පිළිබඳ දැනුවත්

කිරීම අරමුණු කරගෙන ආනයන අපනයන ක්‍රියාපටිපාටිය පිළිබඳව සම්මන්ත්‍රණ හා වැඩමුළු සංවිධානයද මෙම කාලසීමාව තුළදී අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සිදු කෙරිණි.

අපනයන සංවර්ධන මණ්ඩලය සඳහා වර්තමානයේ මූලපාධාර සැපයෙන්නේ සියයට 45 ට සහ ඊට ඉහළ තීරුබදු සීමාවට යටත්වන සියළුම ආනයනයන්ගෙන් අයකර ගන්නාවූ විශේෂ සෙස් බද්දකිනි. කෙසේ වුවද 1995 පෙබරවාරි සිට කාණ්ඩ තුනකින් යුත් තීරුබදු ව්‍යුහයක් හඳුන්වාදීමේදී තීරුබදු සියයට 45 ක මට්ටමේ පැවැති භාණ්ඩ විශාල ප්‍රමාණයක බදු සීමාව සියයට 35 දක්වා අඩු කරන ලදී. එබැවින් ඉහත සඳහන් සෙස් බද්ද යටතේ වර්තමානයේ පවතින භාණ්ඩ සංඛ්‍යාව සුළු ප්‍රමාණයක් වන අතර, එය අපනයන සංවර්ධන මණ්ඩලයේ කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත හැකි අරමුදල් සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීමකට හේතු විය. ආනයන සෙස් බද්ද, තීරු බදු ව්‍යුහය විකෘති කිරීමකි. එය බදු ව්‍යුහය විධිමත් කිරීමේ සහ ව්‍යාකූලතා ඉවත් කිරීම සඳහා රජය ගන්නා උත්සාහය හා අනුරූප නොවේ. මූල්‍යමය බාධාවන් පවතින තත්ත්වය යටතේ අපනයන සංවර්ධන මණ්ඩලය සපයන සේවාවන් ස්වයංමූල්‍යකරණය කිරීමේ අරමුණ ඇතිව එහි කාර්යභාරය විමසීමට ලක් කළ යුතුවේ.

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (ශ්‍රීලං.අ.ණ.ර.ස.) මගින් ශ්‍රී ලංකාවේ අපනයන දියුණු කිරීම සඳහා අපනයනකරුවන්ට ණය රක්ෂණ ආවරණ සහ බැංකු ඇපකර නිකුත් කිරීමේ පහසුකම් නොකඩවා මෙම වර්ෂය තුළදී ද ලබා දුනි. 1996 වසර තුළදී මෙම අපනයන රක්ෂණ සහතික දරන්නන්ගේ සංඛ්‍යාව 188 ක්වූ අතර, ඒවායේ උපරිම වටිනාකම රුපියල් දශලක්ෂ 1,075 ක් විය. තවද මෙම කාලසීමාව තුළ නිකුත් කල ඇපකර සංඛ්‍යාව 1,216 ක් වූ අතර වටිනාකම රුපියල් දශලක්ෂ 2,532 ක් විය. කෙසේ වුවද, 1996 වසර මුල් භාගයේ කොළඹ දිස්ත්‍රික්කයේ සිදුවූ සිවිල් බාධා කටයුතුවල බලපෑම්, නියගය, විදුලිබල අර්බුදය සහ සමහර අපනයන ආයතනවල පැවැති කම්කරු ආරවුල් නිසාද ශ්‍රී.ලං.අ.ණ.ර.ස. හි ක්‍රියාකාරිත්වයට අහිතකර බලපෑම් ඇති විය. අපනයනකරුවන් සඳහා රක්ෂණ ආවරණ සැපයීමේදී ශ්‍රීලං.අ.ණ.ර.ස. මගින් ආවරණ දරන්නන් සඳහා ඔවුන්ගේ නිෂ්පාදන මිලදී ගන්නන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව හා විශ්වාසනීයත්වය පිළිබඳව උපදෙස් සැපයීමද සිදු කරන ලද අතර විවිධ රටවල් රාශියකට අපනයන කිරීම සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය ලබා ගැනීමටද අපනයනකරුවන්ට සහාය වන ලදී. මීට අමතරව, මැණික් සහ ස්වර්ණාභරණ අපනයනකරුවන්ට විදේශීය වෙළෙඳ ප්‍රදර්ශනවලට සහභාගිවීමේදී තීරුබදු රහිතව පිවිසීමේ පහසුකම් ලබාදීම සඳහා හඳුන්වාදෙනු ලැබූ ණය සහතික යෝජනා ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යනු ලැබිය. මෙම යෝජනා ක්‍රමය යටතේ අපනයනකරුවන්ට ඇපකර ආරක්ෂණයක් නොමැතිව විදේශීය ප්‍රදර්ශන සඳහා තීරුබදු රහිතව ප්‍රවේශවීමට ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ ශ්‍රී ලංකා ජාතික සභාවෙන් නිකුත් කරන ඇතුල්වීමේ තාවකාලික අවසර පතක් ලෙස පිළිගත් සහතිකයක් ලබා ගැනීමටද සහය දෙනු ලැබිය. අපනයනකරුවන්, අපනයන ශක්‍යතාවයක් ඇත්තන්ට සහ බැංකු නිලධාරීන්ට අපනයන ණය රක්ෂණය පිළිබඳව සහ අපනයනය සඳහා බැංකු මගින් මූල්‍යාධාර සැපයීම පිළිබඳව දැනුම ලබාදීම සඳහා ලංකා බැංකුව, මහජන බැංකුව සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ සහයෝගයෙන් ප්‍රාදේශීය වැඩමුළු පෙලක් ශ්‍රීලං.අ.ණ.ර.ස. මගින් පවත්වන ලදී.

## නැව් ගාස්තු

නාවික වෙළෙඳාම ලිහිල් කිරීම නිසා නැව් සමාගම් අතර වර්ධනයවූ තරගකාරීත්වය 1996 වර්ෂය තුළදී Non-Vessel Operating Common Carriers (NVOCCS) ක්‍රමය භාවිතයට පැමිණීම හේතුවෙන් තවදුරටත් වර්ධනයවීම නිසා ගමනාන්ත කිහිපයක් සඳහා නැව් ගාස්තු තව දුරටත් පහත වැටුණි. එක්සත් රාජධානිය, උතුරු අර්ධද්වීපය, මධ්‍යධරණී කලාපය, ප්‍රංශය, ඊජිප්තුව සහ සිරියාව සඳහා නැව් ගත කරන සියළු වෙළෙඳ ද්‍රව්‍ය සඳහා නැව් ගාස්තු 1996 වසර තුළදී පහත වැටුනු අතර ඇමරිකා එක්සත් ජනපදය සහ නැගෙනහිර කැනඩාව සඳහා ගාස්තු නොවෙනස්ව පැවතිනි. එක්සත් රාජධානිය සහ උතුරු අර්ධද්වීපය සඳහා නැව් ගාස්තු වෙන් වෙන් වශයෙන් සියයට 17 බැගින් අඩුවූ අතර මධ්‍යධරණී ප්‍රදේශය සඳහා අඩුවීම සියයට 22 ක් විය. කෙසේ වුවද, පාකිස්ථානයට නැව්ගත කරන සියළුම භාණ්ඩ සඳහා නැව් ගාස්තු 1996 වසර තුලදී 11 කින් වැඩි විය. නැව් ගාස්තු අඩුවීමේ ප්‍රවනතාවයට තවත් හේතුවක් වූයේ ප්‍රධාන නැව් සේවාවන් වැඩි ප්‍රමාණයක් සිය නාවික ගාස්තු ව්‍යුහය, වෙළෙඳ ද්‍රව්‍ය මත පදනම්වූ ක්‍රමයක සිට සියල්ල එක්ව ගත් පොදු ක්‍රමයක් (Freight of All Kinds -FAK) වෙතට වෙනස් කරනු ලැබීමයි. ඔස්ට්‍රේලියාව, ඩුබායි, ජෙඩා සහ ජෝර්දානය ආවරණය කරන නැව් සේවා ඔවුන්ගේ නාවික ගාස්තු ව්‍යුහය 1996 වසර තුළදී FAK ක්‍රමයට වෙනස් කරන ලදී. එබැවින් ජෙඩා හැරුනු කොට එම ගමනාන්ත දක්වා නැව්ගත කරන භාණ්ඩ වැඩි ප්‍රමාණයක නැව් ගාස්තු 1996 දී පහත වැටුණි. ජෙඩා සඳහා යැවෙන කෙඳි සඳහා නැව් ගාස්තු සියයට 3 කින් පහත වැටුනු අතර අනෙකුත් සියළුම භාණ්ඩ සඳහා නැව් ගාස්තු නොවෙනස්ව පැවතිනි. ජපානය සහ සිංගප්පූරුව වැනි ඈත පෙරදිග ගමනාන්ත දක්වා නැව් ගාස්තුද 1996 වසරේදී පහත වැටුණි.

## 9.12 වෙළෙඳ සබඳතා, වෙළෙඳ හා නිශ්කාෂණ වැඩපිළවෙලවල්

පවත්නා වෙළෙඳ බාධක ඉවත් කිරීම මගින් ආර්ථිකය වඩාත් විවෘතකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාව සිය වෙළෙඳ ප්‍රතිපත්ති මෙහෙයවීම නොකඩවා සිදු කරනු ලැබිය. දකුණු ආසියාවෙහි වඩාත්ම නිදහස් ආර්ථිකය ලෙස ශ්‍රී ලංකාව ශ්‍රේණිගත කර ඇත. ලෝක උරුම පදනම (World Heritage Foundation) සහ වෝල් ස්ට්‍රීට් ජර්නලය (Wall Street Journal) ඒකාබද්ධව මෙම වර්ෂය තුළ කරන ලද අධ්‍යයනයක මෙම ජයග්‍රහනයන් පිළිබිඹු කොට තිබේ.

ශ්‍රී ලංකාව ලෝක වෙළෙඳ සංවිධානයෙහි (ලෝ.වෙ.සං.) ආරම්භක සාමාජිකයෙකු ලෙස 1996 වසර තුළදී ලෝ.වෙ.සං. ට ඉටු කළ යුතු කෙටිකාලීන හා දීර්ඝකාලීන වගකීම් ඉටු කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලවල් වලට මුල පිරිය. මෙම වැඩපිළිවෙලට උපකාරී වනු පිණිස දේශීය හා විදේශීය වෙළෙඳ, වාණිජ හා ආහාර අමාත්‍යංශය විසින් අමාත්‍ය මණ්ඩල අතර සම්බන්ධතා කමිටුවක් (අ. අ. ස. ක.) Inter-Ministerial Coordinating Committee (IMCC) පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවෙහි නීති ව්‍යවස්ථාවන් හා පරිපාලන ක්‍රියාදාමයන් බහුපාර්ශ්වීය, ද්විපාර්ශ්වීය හා ප්‍රාදේශීය ගිවිසුම්හි දක්වන ලද පරිදි ශ්‍රී ලංකාවෙහි වගකීම් හා අනුකූල වන්නේද යන විග නහාවුරු කර ගැනීම පිණිස මෙම කමිටුව නිතිපතා හමුවීමට බලාපොරොත්තු වේ. මෙම ගිවිසුම්වල රාමුව තුළට ගැනෙන කරුණු වලට අදාලව ශ්‍රී ලංකාව විසින් ලගා කර ගත යුතු තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීමද මීට අමතරව මෙම කමිටුවෙන් බලාපොරොත්තු වේ. මෙම ගිවිසුම්වල විවිධ අංශයන් සමග කටයුතු කිරීම සඳහා අ.අ.ස.ක (IMCC) ට අනුබද්ධව උප කමිටු දහයක් පිහිටුවන ලදී. සුදුසු රාජ්‍ය ආයතනයක නියෝජිතයෙකු මෙම අනුකමිටුවල සභාපතිත්වය දරණ අතර අදාළ රාජ්‍ය ආයතනවල හා පෞද්ගලික අංශයෙහි නියෝජිතයන්ගෙන්ද මෙම කමිටු සමන්විත වේ. අදාළ ගිවිසුම් වලින් ශ්‍රී ලංකාවට ඇති ප්‍රතිවිපාක

අධ්‍යයනය කිරීම මෙම අනුකමිටු මගින් බලාපොරොත්තු වන අතර ඇතැම් අනුකමිටු අදාළ බලධාරීන් වෙත දැනුම් දී යැවීමෙන් ශ්‍රී ලංකාවේ වගකීම් දැනටමත් සපුරා ඇත. තවද මේ අනුකමිටු ලෝ.වෙ.සං. ගිවිසුම් තහවුරු කරනු සඳහා අවශ්‍ය දේශීය නිති සම්පාදනයට අවශ්‍ය මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ නියැලී සිටී. 1996 දෙසැම්බර් මස සිංගප්පූරුවෙහි පැවැති ලෝ.වෙ.සං. හි ප්‍රථම අමාත්‍ය රැස්වීමේදී ශ්‍රී ලංකාව නියෝජනය කළ තත්ත්වය මෙම අනුකමිටු මගින් අනුමත කරන ලද්දකි. රැස්වීමේ න්‍යාය පත්‍රයෙහි කම්කරුවන්ගේ තත්ත්වය, ආයෝජනය, තරගකාරීබව හා රාජ්‍ය අංශයේ මිලදී ගැනීම් වැනි ශ්‍රී ලංකාවට ඉතා වැදගත් වූ කරුණු ද ඇතුලත් විය.

1996 දී ලෝක වෙළෙඳ සංවිධානයෙහි රෙදිපිළි හා ඇඟළුම් ගිවිසුම යටතේ පිහිටුවන ලද රෙදිපිළි සඳහා වන මෙහෙයුම් ඒකකය වෙත අයිතමයන් ලැයිස්තුවක් ඉදිරිපත් කරමින් විවිධ කෙඳි වර්ග සඳහා වන වැඩපිළිවෙළහි අදියර 1 යටතේ වන මෙම වැඩපිළිවෙලින් ඉවත් කිරීමේ පිළිවෙත යටතේ ශ්‍රී ලංකාවට ඇති වගකීම ඉටු කළේය. එසේම රෙදිපිළි සඳහා වන මෙහෙයුම් ඒකකයේ ඉල්ලීම අනුව ශ්‍රී ලංකාව 1998 වසරේදී ක්‍රියාත්මක වීමට නියමිත ඊළඟ අදියරට එකතු කිරීම සඳහා වන දෙවන අයිතම ලැයිස්තුවද ඉදිරිපත් කරන ලදී. අන්තර් ඒජන්ත කමිටුවක් ලෙස රෙදිපිළි පංගු වෙන් කිරීමේ බලයක් ඇතිව රෙදිපිළි පංගු මණ්ඩලය (රෙ.ප.ම.) (Textile Quota Board) ආරම්භයේදී පිහිටුවන ලද්දේ වඩා හොඳින් පංගු ප්‍රයෝජනයට ගැනීම මගින් ඉහළ අපනයන ඉපැයීම් පවත්වා ගැනීම සඳහාය. කෙසේ නමුත් පංගු වෙන් කිරීම සම්බන්ධයෙන් අතීතයේදී ඇතිවූ විවිධ විවේචන සැලකිල්ලට ගනිමින් කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විමසුම් කමිටුවක් පත් කරන ලදී. මෙම කමිටුවේ නිර්දේශයන්ට අනුව රෙ.ප.ම. 1996 රෙදිපිළි පංගු මණ්ඩල පනත මගින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බවට පත් කර ගන්නා ලදී. මේ අනුව රෙ.ප.ම. එම ආයතනයේ පෙර සිටි නිලධාරීන් පස් දෙනෙකුගෙන් හා මෙම කර්මාන්තයෙහි නියැලී ඇති සංගම්වල නියෝජිතයන් පස් දෙනෙකුගෙන්ද සමන්විත වේ.

සහන සපයන වෙළෙඳ භාණ්ඩ සංඛ්‍යාව වඩා පුළුල් කිරීමට හා තිරුබදු සම්බන්ධයෙන් වන අනෙකුත් ගාස්තු හා තිරුබදු නොවන (Para tariff and non tariff) වෙළෙඳ බාධක ඉවත් කිරීම, සඳහා වූ දකුණු ආසියානු වරණීය වෙළෙඳ වැඩපිළිවෙලහි (SAPTA) දෙවන වටය මෙම වසර තුළදී පැවැත්වුණි. මාර්තු මස කොළඹදී පැවැත්වුන වෙළෙඳ ගණුදෙනුවල දෙවන වටයෙහි පළමු රැස්වීමට ශ්‍රී ලංකාව අනුග්‍රහය දක්වන ලදී. දෙවන වටයේ මෙම රැස්වීමට පසුව සැප්තැම්බරයේදී ඉස්ලාමාබාද් හි රැස්වීමක් පැවැත්වූ අතර නොවැම්බර් මස කත්මණ්ඩු නුවර පැවැති රැස්වීමෙන් මෙම සාකච්ඡා වටය අවසන් විය. වෙළෙඳ සාකච්ඡාවල දෙවන වටයේ වාර්තාව හා ජාතික තිරුබදු සහන ලේඛන 1996 දෙසැම්බර් මස නවදිල්ලියේ පැවැත්වූ දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය ද (ආ.ක.ස.සං. SAARC) ඇමැතිවරුන්ගේ මණ්ඩලයෙහි 17 වන සැසි වාරයේදී අනුමත කරන ලදී. 1997 මාර්තු මාසයට පෙරාතුව සහන සඳහා වන ඉල්ලුම් පත්‍ර සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත් සමාප්ත කළ යුතු බවට තීරණය කරන ලදී.

අපනයන සඳහා සැලකිල්ල දක්වන භාණ්ඩ 67ක් සඳහා සාපු සහන දෙවන වටයේ වෙළෙඳ සාකච්ඡා වලදී ශ්‍රී ලංකාවට හිමි විය. ඉන්දියාවෙන් භාණ්ඩ 22 ක්ද, නේපාලයෙන් 14 ක් ද, මාලදිවයිනෙන් 2 ක්ද, බංගලාදේශයෙන් 5 ක්ද, භූතානයෙන් 3 ක්ද වශයෙන් භාණ්ඩ 22 ක් සඳහා තිරුබදු නොවන වෙළෙඳ බාධක රහිත සහනදායී තිරුබදු අනුපාත මීට ඇතුලත් වේ. පකිස්ථානය භාණ්ඩ 21 සඳහා සහනදායී තිරුබදු ප්‍රදානය කළද, ඒවා සඳහා තිරුබදු නොවන වෙළෙඳ බාධක අදාළ වේ. ඌණ සංවර්ධිත රටවලට විශේෂ අනුග්‍රහය දක්වමින්, සැමට එකලෙස අනුග්‍රහය දැක්වීමේ පදනම Most Favored Nation (MFN) මත සාමාජික රටවල් හත එකිනෙකා අතර භාණ්ඩ 1,700 සඳහා තිරු බදු සහන සලසා ගන්නා ලදී.

වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමයෙහි Global System of Trade Preferences (GSTP) දෙවන වටයේ සාකච්ඡා නොවැම්බර් මාසයේදී පැවැත්විණි. ජිනීවා නුවර ශ්‍රී ලංකා දූත පිරිස මෙම වෙළෙඳ සාකච්ඡාවලට සහභාගී විය. වෙළෙඳ සාකච්ඡා සම්මුතියට ප්‍රවේශවීම; එක් එක් භාණ්ඩ වෙන වෙනම සලකා බැලීම, සියළුම භාණ්ඩවලට එකවර බලපවත්වන තිරුබදු පිළිබඳව සහ සෘජු වෙළෙඳ පියවරවල් සම්බන්ධ කරුණු සලකා බැලීමෙහි නියැලුනු වෙළෙඳ සාකච්ඡා කණ්ඩායම් හතර මෙම වටයේ සාකච්ඡා මෙහෙයවනු ලැබීය. මෙම කණ්ඩායම් හතර තමන්ට පවරන ලද බලතල අනුව සිය කාර්යයන් නිම කරනු පිණිස සාකච්ඡා වට කිහිපයක් පැවැත් විය. බොහෝ සාමාජිකයන් සියළු භාණ්ඩ වර්ගයන්ට එකවර බලපවත්වන තිරුබදු සම්බන්ධයෙන් හා සෘජු වෙළෙඳ උපායන් සම්බන්ධයෙන් අඩු උනන්දුවක් දැක්විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස එක් එක් භාණ්ඩ වෙන් වෙන්ව සැලකිල්ලට ගෙන තිරුබදු සහන හුවමාරු කර ගැනීමකට සීමාවූ ප්‍රමාණවත් ජයග්‍රහනයන් සහිතව මෙම වටය අවසන් විය.

බැංකොක් ගිවිසුමෙහි සෙසු සාමාජිකයන්ගෙන් (බංගලාදේශය, ඉන්දියාව, ලාඕසය, පැපුවා නිව්ගිනියාව, කොරියානු සමූහාණ්ඩුව) වරණීය පිවිසුම් පහසුකම් නොකඩවා ශ්‍රී ලංකාවට ලැබුණි. මහජන චීන සමූහාණ්ඩුව 1996 වර්ෂය තුළදී ගිවිසුමට පිවිසීම පිණිස ඉල්ලුම්කර ඇති අතර එය සාමාජික රටවල සැලකිල්ලට භාජනය වෙමින් පවතී. අනෙකුත් සාමාජික රටවල් සමග සමහර අපනයන භාණ්ඩ සඳහා තිරුබදු සහන බලාපොරොත්තුවෙන් ශ්‍රී ලංකාවද චීනය වෙත ඉල්ලීම් ලේඛනයක් ඉදිරිපත් කොට තිබේ. බැංකොක් ගිවිසුමට චීනය බඳවා ගැනීම සම්බන්ධයෙන් තීරණය කිරීම පිණිස 1997 ප්‍රථම භාගය තුළදී රැස්වීමක් පැවැත්වීමට නියමිතව ඇත. චීනයට සාමාජිකත්වය ලබාදීමෙන් කලාපීය වෙළෙඳ වැඩපිළිවෙල ශක්තිමත් වනු ඇතැයි සාමාජිකයෝ අදහස් කරති.

1995 දෙසැම්බර් මස ක්‍රියාත්මකවූ අන්තර්ජාතික ස්වාභාවික රබර් ගිවිසුම International Natural Rubber Agrement (INRA) III" 1996 වර්ෂය පුරාම බලපැවැත්විණි. භාණ්ඩ සඳහා වූ ඒකාබද්ධ වැඩපිළිවෙල යටතේ ඉල්ලුම හා සැපයුම අතර තුලනාත්මක වර්ධනයක් ලබා ගැනීම සඳහා ස්වභාවික රබර් මිල ස්ථායිකරණය කිරීමේ අරමුණින් යුතුව සාකච්ඡා කරන ලද ගිවිසුම් මාලාවක තුන් වැන්න මෙය වේ. පෙර ගිවිසුමෙහි හා (INRA) III ගිවිසුමෙහි මූලික වෙනස වූයේ වර්තමාන ගිවිසුම වෙළෙඳපොළෙහි උපනතින්ට සමපව ක්‍රියාත්මක වීමය.

අන්තර් ජාතික කෝපි සංවිධානය අපනයන පංගු ක්‍රමය මුළුමනින්ම අහෝසි කරන ලද බැවින් අන්තර් ජාතික කෝපි ගිවිසුම පිළිනොගැනීමට ශ්‍රී ලංකාව තීරණය කළේය. මෙම තීරණය අන්තර ජාතික කෝපි සංවිධානය වෙත දැනුම් දෙන ලදී. මෙම දැනුම් දීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවෙන් කෝපි අපනයනය ආවරණය කරමින් සහතික නිකුත් කිරීම නතර කරනු ඇත.

1996 වසර තුළ ශ්‍රී ලංකාව සෙසු ලෝකයා සමග පැවති ද්විපාර්ශික වෙළෙඳ හා ආර්ථික සහයෝගිතාවයෙහි සැලකිය යුතු වැඩි දියුණුවීමක් පෙන්නුම් කළේය. ඉරාන - ශ්‍රී ලංකා වෙළෙඳ,ම, ආර්ථික හා කාර්මික සහයෝගිතා

සඳහා වන ඒකාබද්ධ කොමිෂමෙහි හතරවන සැසි වාරය ටෙහෙරාන් නුවරදී පැවැත්විණි. මෙම රැස්වීමේදී ඉරානය දෙරට අතර වෙළෙඳාම සම්බන්ධයෙන් වන අසමතුලිතතාව අඩු කිරීමේ අරමුණින් බද්ධ ව්‍යවසායයන් ආරම්භ කිරීමට ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ විය.

ශ්‍රී ලංකාව හා ඊජිප්තුව අතර පැවති වෙළෙඳාම සම්බන්ධයෙන් වන ඒකාබද්ධ කමිටුව, ඒකාබද්ධ කොමිසමක් දක්වා වැඩිදියුණු කරන ලදී. මෙම කොමිසමේ ප්‍රථම සැසිවාරය කයිරෝ නුවර පැවැත්වූ අතර ශ්‍රී ලංකාව යෝජනා කරන ලද පරිදි ඊජිප්තුව ද ශ්‍රී ලංකාවෙහි බද්ධ ව්‍යවසායයන් පිහිටුවීමට ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ විය.

ශ්‍රී ලංකා - චීන වෙළෙඳාම ආර්ථික හා කාර්මික සහයෝගිතාවය සඳහා වන ඒකාබද්ධ කොමිසමේ සැසිවාරයන් 1996 වසරේදී බීජිං නුවරදී පැවැත්විණ. මෙම ඒකාබද්ධ කොමිසමේ සැසි වාරයේදී ලැබූ වඩා වැදගත් ප්‍රතිඵලය නම් ශ්‍රී ලංකාවෙහි බද්ධ ව්‍යවසායයන් ආරම්භ කිරීම සඳහා සුදුසු ක්ෂේත්‍රයන් (පැන්සල් කර්මාන්තය, සහල් නිවුඩු තෙල්, ගැඹුරු මුහුදෙහි මත්ස්‍ය කර්මාන්තය) හඳුනා ගැනීමයි.

1996 වසරේ දී ශ්‍රී ලංකාව ක්වේටය හා සයිප්‍රසය සමඟ වන ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් ස්ථිර කර ගන්නා ලදී. එසේම තායිලන්තය හා ඉන්දුනීසියාව සමග වෙළෙඳ ගිවිසුම් අත්සන් කළේය. අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම හා වාණිජ්‍ය සහ ආහාර අමාත්‍යාංශය විසින් යෝජනා කරන ලද පරිදි ඛණිජ තෙල් නිෂ්පාදන මිලදී ගන්නා රටවල් සමග වෙළෙඳ සබඳතා වැඩිදියුණු කොට ඒකාබද්ධ වෙළෙඳ හවුලකට එළඹීමට රජය එකඟ විය. ආනයන හා අපනයනකරුවන්ගේ ගණුදෙනු පියවීම්, ආසියානු නිශ්කාෂණ සංගමයේ (අ.නි.සං) මගින් සිදු කිරීමට යම් මැලිකමක් වී නම් එයද අහෝසි කරමින් වර්ෂය ආරම්භයේ සිටම ආ.නි.සං. සාමාජික රටවල් අතර ගණුදෙනු ඇ.එ.ජ. ඩොලරය මගින් සිදු කිරීමට අවසර දෙන ලදී.

## 9.13 අභ්‍යන්තර වෙළෙඳාම හා ආයතනික වැඩපිළිවෙලවල්

අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව (අ.වෙ.දෙ.) විසින් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම පිණිස පාරිභෝගික ආරක්ෂක පනත, මිල පාලන පනත, කිරුම් හා මිණුම් ආඥා පනත යටතේ තමන්ට පැවරී ඇති කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. දෙපාර්තමේන්තුවේ හදිසි වැටලීම් අංශය, හදිසි වැටලීම් හා අධීක්ෂණය මගින් අභ්‍යන්තර වෙළෙඳාම හැසිරවීමෙහි නියැලිණි. 1996 දී රටෙහි අභ්‍යන්තර වෙළෙඳාම මෙහෙයවීම පිණිස දෙපාර්තමේන්තුව සාර්ථක වැටලීම් 1,821 ක් ද චෝදනා ඉදිරිපත් කිරීම් 1,483 ක් ද වෙළෙඳ සෝදිසි කිරීම් 44,960 ක් ද සිදු කරන ලදී. පාරිභෝගික ආරවුල් විසඳීම සලකා මෙහි ප්‍රධාන කාර්යයක් විය. ප්‍රධාන වශයෙන් ගුණාත්මකබවෙහි අඩුකම, වෙළෙඳාමට පසු සේවයෙහි අඩුපාඩු ආදිය පිළිබඳව කරන ලද පැමිණිලි පාරිභෝගිකයාට වියදමක් ඇති නොවන පරිදි විසඳන ලදී. මීට අමතරව පොහොර වෙළෙඳාමෙහි සිදුවන අක්‍රමිකතා ඉවත් කිරීමේ අපේක්ෂාවෙන් පොහොර පනත ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයට තවදුරටත් සහාය විය.

වෙළෙඳාමේදී භාවිතා කරන මිණුම් පාවිච්චිය හා පාලනය සම්බන්ධව නීතිය වඩා ක්‍රමවත් කිරීමට සහ කර්මාන්ත, සෞඛ්‍ය, පරිසරය සුරැකීම හා ආරක්ෂාව යන අංශයන් සඳහා නීතිමය වශයෙන් පිළිගන්නා සහතික නිකුත් කිරීම පිණිස, නීතිමය රාමුවක් නිර්මාණය කර ගැනීම සඳහා මිණුම් සහ සේවාවන් පිළිබඳ කෙටුම්පත 1995 දී සම්මත කරන ලදී. වාර්ෂික පරීක්ෂා කිරීමේ වැඩපිළිවෙල යටතේ කිරුම් හා මිණුම් ඒකක 1,433,684 ක් පරීක්ෂා කොට ආරක්ෂාව සඳහා මුද්‍රා තබන ලදී.

ආ.වෙ.දෙ. මගින් පොදු ජනතාව හා පාසැල් සිසුන් දැනුවත් කිරීමේ අදහසින් පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලවල්, සම්මන්ත්‍රණ සහ ප්‍රශ්න විචාරාත්මක වැඩපිළිවෙලවල් මෙහෙයවන ලදී.

සාධාරණ වෙළෙඳ කොමිසම (සා.වෙ.කො.) මගින් ඒකාධිකාරී තත්ත්වයන් හා ඒකාබද්ධවීම්, තරගකාරීත්වයට පටහැනි ක්‍රියාවන් හා සම්බන්ධ පරීක්ෂා කිරීම් සහ දැනට මිල පාලනය යටතේ පවත්වාගෙන යනු ලබන එකම භාණ්ඩය වන ඖෂධ වර්ගවල උපරිම මිල තීරණය කිරීම යන කටයුතු නොකඩවා කරන ලදී. කොමිසම මගින් ආනයනකරුවන් 77 දෙනෙකු ආනයනය කරනු ලබන සහ දේශීය නිෂ්පාදකයන් 7 දෙනෙකුගේ ඖෂධ වර්ග 5,000 ක් පමණ මිල පාලනය කරන ලදී. කැබිනට් තීරණයක් අනුව 1996 දී දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන අත්‍යවශ්‍ය ඖෂධ වර්ග කිහිපයක් මිල පාලනයෙන් ඉවත් කරන ලදී. සා.වෙ.කො. මගින් කුකුල් ආහාර, දිනක වයසැති කුකුළු පැටවුන් සහ සකස් කළ කුකුළ් මස්, ස්ප්‍රිතු සහ මත්පැන් සැපයීම සම්බන්ධව ඒකාධිකාරී බලය හා තරගකාරීත්වයට පටහැනිව කටයුතු කිරීම පිළිබඳව කරන ලද පැමිණිලි සා.වෙ.කො. පනත යටතේ සෝදිසි කරන ලද අතර, චීන පැන්සල් දේශීය වෙළෙඳපොලෙහි නිෂ්පාදන මිලට වඩා අඩු මිලට විකිණීම පිළිබඳව කරන ලද පැමිණිලි ද පරීක්ෂා කරන ලදී.

සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (ස.තො.ස) ප්‍රධාන ආහාර ද්‍රව්‍ය ආනයනය, ආහාර ද්‍රව්‍ය හා අනෙකුත් පාරිභෝගික භාණ්ඩ තොග හා සිල්ලර වෙළෙඳාම යන කටයුතු වල නිරත විය. දේශීය වෙළෙඳාම ව්‍යාප්ත කිරීමේ අදහසින් යුතුව 1995 දී හඳුන්වා දෙන ලද දීප ව්‍යාප්ත වරලත් අලෙවි සැල් යෝජනා ක්‍රමය යටතේ 1996 අවසානය වන විට ක්‍රියාත්මක වෙමින් පවතින වරලත් අලෙවිසැල් සංඛ්‍යාව 7,927 ක් බවට පත් කරමින් නව වරලත් නියෝජිතයින් 604 දෙනෙකු පත් කිරීම මගින් තවදුරටත් ව්‍යාප්ත කරන ලදී. භාණ්ඩ සපයා ගැනීමේ වියදම අඩුකර ගැනීමට සහ වෙළෙඳාම පුළුල් කර ගැනීම පිණිස පෞද්ගලික ආනයනකරුවන්ගෙන් මිලදී ගැනීම වෙනුවට අවශ්‍ය යයි සැලකෙන සෑම අවස්ථාවකදීම ප්‍රධාන ආහාර ද්‍රව්‍ය ස.තො.ස විසින්ම ආනයනය කරන ලදී. ස.තො.ස විසින් 1996 දී ආනයනය කරන ලද සහල් ප්‍රමාණය මුළු සහල් ආනයනයෙන් සියයට 11 ක් විය. 1995 හා 1996 යන දෙවසර අතර රතු පරිප්පු ආනයනයෙන් ස.තො.ස. ට හිමි කොටස සියයට 42 සිට සියයට 8 දක්වා පහත වැටුණු අතර වියලි මිරිස් සඳහා හිමිව තිබූ කොටස සියයට 19 සිට සියයට 5 දක්වා පහත වැටුණි. පෞද්ගලික අංශයේ වැඩිවෙමින් පවතින තරගකාරීත්වය යටතේ ලොකු ළූණු, අර්තාපල් සහ සීනි ආනයනයෙන් ස.තො.ස. හිමිකර ගත් කොටස් පිළිවෙලින් සියයට 7, සියයට 6 සහ සියයට 5 වශයෙන් පහත් මට්ටමක පැවතුණි. තිරිඟු ආනයනය මුළුමණින්ම කරන ලද්දේ ස.තො.ස. මගිනි. මේ අතර, 1995 දෙසැම්බරයේදී රුපියල් 11.15 ක් ව තිබූ තිරිඟු පිටි කිලෝග්‍රෑමයක තොග මිල 1996 දෙසැම්බර් අවසාන වන විට රුපියල් 16.15 දක්වා වැඩිකිරීමත් සමගම, තිරුඟු පිටි මිල සහනාධාරය ක්‍රමානුකූලව පහත වැටෙමින් පැවතුණි. මෙම මිල වැඩි කිරීම නිසා 1995 දී කිලෝග්‍රෑමයකට රුපියල් 4.95 ක්ව පැවති මෙම මිල සහනාධාරය 1996 අවසානය වන විට කිලෝග්‍රෑමයකට රුපියල් 2.55 දක්වා අඩු කිරීමට හැකි විය. ඉතිරිව පවතින සහනාධාර

කොටසද මුළුමනින්ම ඉවත් කොට තිරිඟු පිටි හා පාන් සඳහා නම්‍ය මිල තීරණය වීමකට ඉඩ හැරීම ඉතාම වැදගත්ය. පෞද්ගලික අංශයට තිරිඟු ආනයන වෙළෙඳාමට ඇතුලත්වීමට ඉඩ හැරීම සහ ඔවුන්ට ද පිටි ඇඹරුම් සමාගම සමග සෘජුවම ගණුදෙනු කිරීමට ඉඩදීම මගින් මීට ඉඩකඩ සැලසිය හැක. මීට අමතරව රාජ්‍ය ව්‍යවසායයන් ආනයන වෙළෙඳාමෙහි නියුක්තවීම සැමවිටම වෙළෙඳ වාතාවරණය තුළ ඉතා ඉහළ මට්ටමක අස්ථිරතාවයක් ඇති කරනු ලබන අතර වඩා කාර්යක්ෂමවීමට හැකියාව ඇති පෞද්ගලික වෙළෙඳුන් ඉවත් කොට තැබීමක් හා වෙළෙඳපොල කාර්යක්ෂමතාව පීඩාවට පත් කිරීමක් සිදු කෙරේ.


1996 ජූනි 30 වන දින සිට බලපැවැත්වෙන පරිදි වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුවේ (වෙ.මි.දෙ) කටයුතු අවසන් කිරීම හේතුවෙන් එහි කටයුතු 1996 ප්‍රථම භාගයට පමණක් සීමා විය. මීට් රබර් මිලට ගැනීම, දෛනික මිල ගණන් ප්‍රකාශයට පත් කිරීම, රබර් සකස් කිරීම සඳහා අවශ්‍ය වන රසායනික ද්‍රව්‍ය හා උපකරණ කුඩා ඉඩම් හිමියන්ට සැපයීම හා බෙදා හැරීම වැනි සේවා සැපයීම මගින් කුඩා රබර් වතු හිමියන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමේ අරමුණින් යුතුව වෙ.මි.දෙ. 1941 දී පිහිටු වන ලදී. වෙළෙඳ නිදහසට පසුව රබර් වෙළෙඳපොල තරගකාරීවීම, ප්‍රමාණවත් නොවූ මිලදී ගැනීමේ ආයතන ව්‍යුහය හා මිල උච්චාවචනය වීමේ ස්වභාවය හේතුකොට දෙපාර්තමේන්තුවේ කටයුතු දිගටම අඩුවෙමින් පැවතුන බැවින් වෙ.මි.දෙ. ට අයවැය ප්‍රතිපාදන මගින් සැපයූ අරමුදල් 1996 වර්ෂය මැද දී නවතා දැමීමට රජය තීරණය කරන ලදී.

## 9.14 සංචාරක ව්‍යාපාරය

1996 ජනවාරි මාසයේ දී කොළඹ සිදු වූ බෝම්බ ප්‍රහාරය නිසා දැඩි පසුබෑමකට ලක්වූ සංචාරක කර්මාන්තය වර්ෂය අවසානය වන විට ක්‍රමයෙන් යථා තත්ත්වයකට පත්වෙමින් පැවතිණි. කෙසේ වුවද, 1996 වර්ෂයේදී සංචාරකයින්ගේ පැමිණීම 302,265 ක්ව සියයට 25 කින් පහත වැටිණි. මේ හේතුවෙන් 1995 වර්ෂයේ දී විශාල ඩොලර් මිලියන 149 ක් වූ (රුපියල් දශලක්ෂ 11,569) සංචාරක කර්මාන්තයේ දළ ඉපැයීම් 1996 දී විශාල දශලක්ෂ 115 ක් (රුපියල් දශලක්ෂ 9,195) දක්වා සැලකියයුතු අන්දමින් සියයට 23 කින් පහත වැටුණි.

සංචාරක පැමිණීම්වල සැලකියයුතු පහත වැටීම හේතුකොටගෙන, විදේශ සංචාරක රාත්‍රී දින ගණන් සියයට 27 කින් අඩුවූ අතර, සමස්ත හෝටල් උපයෝජන අනුපාතය 1995 වර්ෂයේවූ සියයට 53 හා සැසඳීමේදී 1996 දී සියයට 40 දක්වා සැලකිය යුතු අන්දමින් අඩුවිය. කලාපීය බෙදීම් අනුව මහ කොළඹ සහ කොළඹ නගරයේ හෝටල් උපයෝජන අනුපාතය සියයට 58 හා සියයට 55 සිට පිළිවෙලින් සියයට 49 හා සියයට 45 දක්වා අඩුවිය. දකුණු වෙරළබඩ ප්‍රදේශයේ හෝටල් උපයෝජන අනුපාතය සියයට 50 සිට සියයට 35 දක්වාත්, පෞරාණික නගරයන්හි සියයට 52 සිට සියයට 38 දක්වාත් අඩුවිය. එසේ වුවද 1996 වර්ෂයේ දේශීය සංචාරක රාත්‍රී දින ගණන් සියයට 10 කින් වැඩිවීම හේතුවෙන් හෝටල් උපයෝජන අනුපාතයේ ඇති වූ විශාල අඩුවීම තරමක් දුරට සමනය කර ගැනීමට හැකිවිය.

වර්ගීකරණය කරන ලද නවාතැන් අංශයේ වූ හෝටල් සංඛ්‍යාව 138 සිට 143 දක්වාද, කාමර ධාරිතාවය 1995 පැවති 11,225 සිට 1996 දී 11,600 දක්වා ද වැඩිවිය. කාමර ඇඳන් අනුපාතය ද 1 . 9 ක්ව පෙර වසරෙහි පැවති මට්ටමෙහි නොවෙනස්ව පැවතුණි. එසේ වුවත් හෝටල් අංශයෙහි වූ කාමර ධාරිතාවයෙහි වර්ෂයකට සංචාරකයන් 600,000 ට පහසුවෙන් නවාතැන්




පහසුව සැලසිය හැකි වුවත් සංචාරක කර්මාන්තයේ පැවති මන්දගාමී ක්‍රියාකාරීත්වය නිසා උපයෝගීකරණය හා නැවතීම් පහත මට්ටමක පැවතීමට හේතුවිය. සංචාරක හෝටල් හිමියන් අපහසු තත්ත්වයකට පත් කරමින් 1996 වර්ෂයේ සංචාරක පැමිණීම් මෙම නවාතැන් ධාරිතාවයෙන් අඩක් පමණ විය. 1996 වර්ෂයේ සේවා නියුක්තිය ද 4,500 කින් පමණ අඩු වූ බව ඇස්තමේන්තු කර ඇත.

පසුගිය වර්ෂය හා සසඳන කල්හි සියළුම ප්‍රධාන කලාපීය ප්‍රදේශ වලින් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාවෙහි තියුණු අඩුවීමක් වාර්තා විය. පැමිණෙන මුළු සංචාරකයින්ගේ සංඛ්‍යාවෙන් සියයට 55 කට දායක වෙමින් ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණෙන ප්‍රධාන මූලාශ්‍රය වන බටහිර යුරෝපයෙන් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සියයට 33 ක පහත වැටීමක් පෙන්නුම් කරයි. දෙවන මූලාශ්‍රය වන ආසියාවෙන් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සියයට 13 කින්

**සංඛ්‍යා සටහන 9.12**
**සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යාලේඛන**

| | ශීර්ෂය | 1994 | 1995 (අ) | 1996 (ආ) | ප්‍රතිශත වෙනස 1995 | ප්‍රතිශත වෙනස 1996 |
|---|---|---|---|---|---|---|
| 1. | සංචාරක පැමිණීම් | 407,511 | 403,101 | 302,265 | -1.1 | -25.0 |
| 2. | සංචාරක දින (රාත්‍රී) ගණන (දහස්) | 4,251 | 3,918 | 3,072 | -7.8 | -21.6 |
| 3. | කාමර උපයෝජන අනුපාතය (%) | 56.6 | 52.6 | 40.3 | -7.1 | -23.4 |
| 4. | දළ සංචාරක ලැබීම් (රු.දශ ලක්ෂ) | 11,375 | 11,569 | 9,195 | 1.7 | -20.5 |
| 5. | ඒක පුද්ගල සංචාරක ලැබීම් (රුපියල්) | 27,913 | 28,700 | 30,420 | 2.8 | 6.0 |
| 6. | මුළු සේවා නියුක්තිය | 84,154 | 87,360 | 82,828 | 3.8 | -5.2 |
| | සෘජු | 35,064 | 36,260 | 33,131 | 3.4 | -8.6 |
| | වක්‍ර | 49,090 | 51,100 | 49,697 | 4.1 | -2.7 |

(අ) සංශෝධිතයි
(ආ) තාවකාලිකයි

මූලයන්: ලංකා සංචාරක මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

අඩු විය. ඕස්ට්‍රේලියාව, උතුරු ඇමරිකාව සහ නැගෙනහිර යුරෝපයෙන් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව පිළිවෙලින් සියයට 15, සියයට 14 සහ සියයට 1 යනාදී වශයෙන් පහත වැටිණි. කෙසේ වුවත් 1996 ඔක්තෝබර් මාසයෙන් පසු මෙම සියළුම කලාප වලින් පැමිණි සංචාරක සංඛ්‍යාවන්හි තරමක ප්‍රගතියක් දක්නට ලැබුණි.

සංචාරකයින්ගේ පැමිණීම්වල ප්‍රධාන අරමුණ වූයේ නිවාඩුගත කිරීමය. එසේ සම්ප්‍රාප්ත වූ සංචාරකයින්ගෙන් සියයට 67 ක්ම අන්තර් කලාපීය ගුවන්යානා වලින් පැමිණි අතර, සියයට 28 ක් කලාපීය ගුවන් යානා වලින් පැමිණියහ. එයාර් ලංකා ගුවන්යානා මගින් 1995 පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව මුළු සංචාරකයින්ගෙන් සියයට 27 ක් වූ අතර 1996 දී එය සියයට 28 ක් විය.